# දිළිඳුබව හා සංවර්ධනය අවබෝධ කරගැනීම:

## ජනමාධ්‍යවේදීන් සඳහා මාර්ගෝපදේශන සංග්‍රහයක්



centre for poverty analysis

# දිළිඳුබව සහ සංවර්ධනය අවබෝධ කරගැනීම:

## ජනමාධ්‍යවේදීන් සඳහා මාර්ගෝපදේශන සංග්‍රහයක්

දරිද්‍රතා විශ්ලේෂණ කේන්ද්‍රය වෙනුවෙන්
නාලක ගුණවර්ධන විසින් ඉංග්‍රීසි බසින් සකස් කළ
මාර්ගෝපදේශන සංග්‍රහය පරිවර්තනය කරන ලද්දේ W.C. රාජපක්ෂ විසිනි.

දිළිඳුකම විමර්ශනය කිරීම පිණිස මාධ්‍යයන්හි හැකියාවන් ගොඩනැගීමේ
ව්‍යාපෘතිය යටතේ යුනෙස්කෝ සංවිධානය විසින් අරමුදල් සම්පාදිතයි.

සැප්තැම්බර් 2016

# දිළිඳුබව සහ සංවර්ධනය අවබෝධ කරගැනීම:
## ජනමාධ්‍යවේදීන් සඳහා මාර්ගෝපදේශන සංග්‍රහයක්


1. හැඳින්වීම
2. දිළිඳුකම පිළිබඳ වැදගත් කතාවක්
3. දුගීකම නොදුටු සේ හැසිරෙන මාධ්‍ය කලාවේ දුගී බව
4. දිළිඳුබව හඳුනා ගැනීම : දළ විශ්ලේෂණයක්
5. දිළිඳුබව හඳුනා ගැනීම : සවිස්තරාත්මක විශ්ලේෂණයක්
6. දිළිඳුබව වාර්තා කිරීම : සංවර්ධන ජනමාධ්‍යවේදය
7. දිළිඳුබව වාර්තා කිරීම : අභියෝග සහ උපාය මාර්ග
8. මං හෙළි පෙහෙළි කළ අයගේ දැනුමින් බිඳක් : පී. සයිනාත්
9. මං හෙළි පෙහෙළි කළ අයගේ දැනුමින් බිඳක් : කල්පනා ශර්මා

# 1. හැඳින්වීම

මෑතකදී ශ්‍රී ලංකාව මධ්‍ය ආදායම් ලබන රටක් ලෙස නම් කරනු ලැබිණි. දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස සමාජීය ක්ෂේත්‍රය මත රාජ්‍ය වියදම් අඩු වී ඇති අතර මේ තුළින් විෂමතා තව තවත් පුළුල් වී තිබේ. එබැවින්, තවමත් දිළිඳුබව යනු තීරණාත්මක ගැටලුවකි. නමුත් දිළිඳුභාවය අවබෝධ කර ගත යුත්තේ ජනතාවගේ හැකියාවන්, පෞද්ගලික සහ සමාජයීය වත්කම්, තමන්ට විවේකයට ඇති කාලය, සමාජ සහභාගීත්වය සහ ආරක්ෂාව ලැබීම වැනි අංශයන් සලකා බැලෙන වඩාත් පුළුල් දෘෂ්ටිකෝණයකිනි.

කෙසේ නමුත්, බොහෝ මාධ්‍ය, දුප්පත්කම දෙස බලනුයේ මුදල් හිඟකම වැනි කරුණු මත පදනම්ව හුදෙක් ආර්ථිකමය දෘෂ්ටිකෝණයකි. ජනතාවට තමන් සතු සියලු හැකියාවන් අවබෝධ කර ගත හැකි පූර්ව අවශ්‍යතාවයන් ලෙස ප්‍රජාතන්ත්‍රවාදය, යහපාලනය, නීතියේ ආධිපත්‍යය, අදහස් ප්‍රකාශනයේ නිදහස සහ මාධ්‍ය නිදහස යන දෑ ඇතුළත් වීම තුළින් දුප්පත්කම පිළිබඳව පුළුල් අවබෝධයක් ලැබිය හැකිය. දිළිඳුකම පිළිබඳව පවතින අඩු අවබෝධයට අමතරව බොහෝ මාධ්‍යයන්  එම ක්ෂේත්‍රයට අදාළ ක්ෂේත්‍ර පාදක සහ ගවේෂණාත්මක ජනමාධ්‍ය පැවරුම් සඳහා වෙන්කරනු ලබන්නේ ඉතා අවම මුදලක් වන අතර සමහර මාධ්‍ය ආයතන ඒ සඳහා සිය අයවැයෙන් මුදල් වෙන් නොකරන තරම්ය.

දිළිඳුබව සහ සංවර්ධනය පිළිබඳ මාධ්‍ය අධිශිෂ්‍යත්ව වැඩසටහන මඟින් දරිද්‍රතා විශ්ලේෂණ කේන්ද්‍රය (CEPA)  මෙම හිදැස පිරවීමට අපේක්ෂා කරයි.

තරඟකාරී ලෙස තෝරා ගත් ජනමාධ්‍යවේදීන් විසි දෙනෙකුට දිළිඳුකමේ විවිධ මානයන් පිළිබඳව මනා අවබෝධයක් ලබා දීමෙන් සහ අනාවරණය නොවූ සහ අඩුවෙන් වාර්තා වී ඇති දරිද්‍රතාවයේ  විවිධ අංශයන් ආවරණය කිරීම සඳහා මග පෙන්වීම තුළින් ඔවුන්ගේ කුසලතා ඉහළ නැංවීමට අධිශිෂ්‍යත්ව වැඩසටහන තුළින් අපේක්ෂා කරයි.

ශිෂ්‍යත්වලාභීන්ට ජ්‍යෙෂ්ඨ ජනමාධ්‍යවේදීන් සහ සංවර්ධන පර්යේෂකයින් හමු වී අදහස් හුවමාරු කර ගැනීමට ඉඩ ප්‍රස්තාව ලැබෙන අතර ක්ෂේත්‍ර චාරිකා සඳහා වන වියදම් පියවා ගැනීමට දීමනාවක් ද හිමිවනු ඇත. එසේම ඔවුන් කැමති ප්‍රවෘත්ති තේමාවක් ගැඹුරින් සහ විස්තරාත්මක ලෙස අධ්‍යයනය කිරීමේ අවස්ථාව උදාවේ. කෙසේ නමුත් අදාළ ප්‍රවෘත්තියට තම මාධ්‍ය ආයතනයේ ඉඩකඩ ලැබේය යන වැටහීම ඇතිව එය සිදු කළ යුතුය.

මෙම අත්පොත අධිශිෂ්‍යත්ව වැඩසටහනෙහිම කොටසක් ලෙස සකස් කෙරේ. එය ශ්‍රී ලංකාවේ දිළිඳුකම පිළිබඳව තොරතුරු වාර්තාවක් නොවන අතර අපගේ ජනමාධ්‍ය තුළින් දිළිඳුකම අර්ථාන්විත ලෙස වාර්තා කළ හැක්කේ කෙසේද යන්න පිළිබඳව විමසා බැලීමකි.

මෙම වැඩසටහන මූලිකවම මුද්‍රිත, විද්‍යුත් හෝ වෙබ් මාධ්‍යයන්හි ක්‍රියාකාරී, සිය වෘත්තීය දිවියේ මධ්‍යම අවදියේ සිටින ජනමාධ්‍ය වෘත්තිකයන් ඉලක්ක කර ගනියි. මෙම පිරිස සතුව ජනමාධ්‍ය කලාව පිළිබඳ පුහුණුව හෝ අත්දැකීම් ඇතැයි යන්න අනුමාන කරනු ලැබේ.

# 2. දිළිඳුකම පිළිබඳ වැදගත් කතාවක්

**“කතුවරයෙකු ලෙස මට  දිළිඳුකම සම්බන්ධයෙන් කටයුතු කිරීමට බලපාන හේතුවක් තිබේ. අධ්‍යාපනය සහ සාක්ෂාරතාවය ඉහළ යාම, මාගේ  පාඨක පිරිසේ ප්‍රමාණය ඉහළ යාම හා සම්බන්ධ වේ. අපගේ ප්‍රධාන පාඨකයින් නිසැක වශයෙන් ම මධ්‍යම පාන්තිකයින්, ව්‍යාපාරිකයින් සහ ප්‍රතිපත්ති සම්පාදකයින්ගෙන් සමන්විත වන්නකි. නමුත් මෙම කණ්ඩායමට හුදෙකලාව ජීවත්විය නොහැකිය. ඩේලි ස්ටාර් පුවත්පත කියවන ජනතාවගේ අභිප්‍රාය වනුයේ බොහෝ දෙනෙකුගේ සුබ සිද්ධියයි.”**

**මාෆූස් අනාම්, බංගලාදේශයේ ඩේලි ස්ටාර් පුවත්පතේ කතුවර සහ ප්‍රකාශක**

බොහෝ මාධ්‍ය ආයතනයන්හි තේමාවන් බවට පත්වන ‘ගැටලු පරාසය’ තුළ දිළිඳුකම සහ නැතිබැරිකම ඇතුළත් නොවේ.  දුප්පත්කම පිළිබඳ ප්‍රවෘත්ති බොහෝ විට ධෛර්ය හීන කරන, වෙහෙසට පත් කරවන  හෝ අදාළ නොවන ඒවාය යන්න බොහෝ දෙනෙකුගේ විශ්වාසයයි. එහෙත් එය දුර්මතයකි.

කිසියම් ප්‍රවෘත්තියක් ප්‍රමාණවත් ගැඹුරක් ඇතිව වාර්තා කරන්නේ නම් සහ සංවේදීත්වය, සහකම්පනය ඒ තුළ අඩංගු වේ නම් දුප්පත්කම පිළිබඳ ගැටලු අපගේ මාධ්‍ය ග්‍රාහකයන් තුළ විවිධත්වයක්, පැහැදීමක් සහ උත්තේජනයක් ඇති කිරීමට සමත් වනු ඇත. තවද, මෙවැනි ප්‍රවෘත්ති ආකර්ෂණීය ලෙස සහ සිත් ඇද ගන්නා ලෙස ඉදිරිපත් කිරීමට ඕනෑ තරම් ක්‍රම සහ විධි ද තිබේ.

මාෆූස් අනාම් වැනි කතුවරුන් ඉතා විරලය. බොහෝ විට දිළිඳුකම ආශ්‍රිත ගැටලු සහ සමාජ සාධාරණත්වය පිළිබඳ ගැටලු වාර්තා කිරීමේ වැදගත්කම තමන්ගේ කතුවරුන්ට ඒත්තු ගැන්වීම සඳහා ජනමාධ්‍යවේදීන්ට දැඩි පරිශ්‍රමයක් දැරීමට සිදු වේ. මිලියන 400කට ආසන්න දුප්පත් ජනතාවක් වෙසෙන ඉන්දියාවේ ඉංග්‍රීසි පුවත්පතක කතුවරයෙකු  වරෙක “දුප්පතුන්ගේ කතාන්තර පිළිබඳ අපගේ ඇල්මක් නැත. මක් නිසාද යත් අපගේ පාඨකයින් අතර දුප්පතුන් නැත” යි ප්‍රකාශ කොට තිබුණි.

එවැනි නරුමවාදීන් විසින් අපේ යුගයේ වැදගත්ම කතා පුවත් අත හැර දමා ඇත. දශක ගණනාවක් තිස්සේ ප්‍රතිපත්තිමය මැදිහත්වීම්, සංවර්ධන ආධාර සහ පරිත්‍යාග කටයුතු සිදු කළද තව දුරටත් විවිධ ස්වරූපයෙන් දුප්පත්කම පවතින්නේ ඇයි ? සහ එසේ පවතින්නේ කෙසේද? මෑත වසරවල්වල සංවර්ධනය වෙමින් පවතින රටවල පවුල් මිලියන ගණනින් අන්ත දුගීභාවයෙන් මිදී ඇතැයි යන කරුණ ද ඔවුන් විසින් නොසලකා හරිනු ලබයි.

නිවැරදි ආර්ථික සහ සමාජ සන්දර්භයක් තුළ සලකා බලන්නේ නම් දිළිඳුකම යනු ඉතාමත් වැදගත් ප්‍රවෘත්තියක් විය යුතුය. දුප්පත්කම යනු කිසි විටෙක මුදල් හිඟකම සහ මූලික අවශ්‍යතා සපුරා ගැනීමට ඇති නොහැකියාව නොවේ. ඉඩම් හිමිකම, සම්පත් බෙදී යාම සහ කාන්තා අයිතිවාසිකම් වැනි විවාදාපන්න කරුණු ද දරිද්‍රතාවය පිළිබඳව වන පුළුල් සංවාදයක දී  අන්තර්ගත විය යුතුම කොටස් වේ.

දිළිඳුකම පවතින්නේ ඇයි සහ එය මැඩපවත්වන්නේ කෙසේ ද යන්න අවබෝධ කර ගැනීමට අප ඒ දෙස පුළුල් දෘෂ්ටිකෝණයකින් බැලිය යුතුය. සංඛ්‍යාලේඛන වාර්තා කිරීම වැදගත් වන නමුත් මාධ්‍ය තුළ දිළිඳුකම වාර්තා කිරීම යනු ඉලක්කම් වාර්තා කිරීමට වඩා වැඩි යමකි. ඒ සඳහා විශාල මට්ටමේ සාධක සමග ක්ෂුද්‍ර මට්ටමේ දැනුම මුසු වූ ඒකාබද්ධ ප්‍රවේශයක් අවශ්‍ය වේ. අන් කවර දේකටත් වඩා ඒ සඳහා අවශ්‍ය වනුයේ ජනමාධ්‍යවේදීන් සතුව විවෘත සහ විමර්ශනශීලි මනසක් පැවතීමයි.

සංවර්ධන විෂමතා පිළිබඳව වූ සංවාද නිසඟයෙන්ම දේශපාලනිකය. ශ්‍රී ලංකාවේ ඕනෑම දේශපාලන සංවාදයක් ක්ෂණිකවම දේශපාලන මතවාදයන් හෝ දේශපාලන පක්ෂ ස්ථාවරයන් මත බෙදීමකට ලක්වේ.

මෙවැනි අවුල් සහගත සටන් තුළ පොදු මිනිසා සහ ගැහැණිය වෙනුවෙන් හඬනගන්නේ කව්රුන්ද? එසේම කවරෙකුට සාධාරණ ඇහුම්කන් දීමක් ලැබේද ?

දුප්පත්කම, අසමානත්වය සහ සමාජ සාධාරණත්වය යන සාධකවල වැදගත්කම ශ්‍රී ලංකාවේ ඉහළම මට්ටමේ දේශපාලන බලයෙන් සහ පාලන තන්ත්‍රයෙන් අවතක්සේරු වන විට හෝ මුළුමනින්ම ප්‍රතික්ෂේප වන විට දිළිඳුකම පිළිබඳ අර්ථවත් ලෙස කතා කරන්නේ කෙසේද?

සංවර්ධනය සහ දිළිඳුකම පිළිබඳ මහජන කතිකාවක් සහ විවාදයක් මතු කරන්නට සහ අඛණ්ඩව පවත්වා ගෙන යාමට ජනමාධ්‍යවේදීන්ට සහ ඔවුන්ගේ මාධ්‍ය ආයතනයන්ට කළ හැකි දෑ බොහෝය. එවැනි සංවාදයක් ශ්‍රී ලංකාව තුළ ගොඩ නැගීම සඳහා මේ තීරණාත්මකම කාලයයි.

ශ්‍රී ලංකාවේ මහා පරිමාණ වෙනස්කම් සිදුවෙමින් පවතී. එනම්

- ශ්‍රී ලංකාව මධ්‍ය ආදායම් ලබන රටක් වී තිබේ.
- සමස්තයක් ලෙස අපගේ ජනගහනය වියපත් වෙමින් පවතී.
- නාගරිකව ජීවත් වන බහුතරයක් පෙර නොවූ විරූ අභිලාෂයන් ඇතිව ජීවත් වෙති.
- සන්නිවේදන තාක්ෂණයට ස්තුති වන්නට සමාජය වඩා වඩාත් ජාල ගත වෙමින් පවතී.

මෙවැනි අභියෝගයන් හේතුවෙන් ඒ පිළිබඳව පර්යේෂණ කරන්නන්ට සහ ඒ පිළිබඳ ක්‍රියාකාරීන්ට අභියෝගයන් එල්ල වී තිබේ. එනම් එම විෂය ක්ෂේත්‍රයන් පිළිබඳව මින් ඉදිරියට ඔවුන් අධ්‍යයනය කරන්නේ, විශ්ලේෂණය කරන්නේ සහ ප්‍රවර්ධනය කරන්නේ කෙසේද? යන්නයි. ඒ සඳහා භාවිතා කළ පැරණි සංකල්පීය රාමු තවදුරටත් ප්‍රමාණවත් නොවේ. නව සදාචාරාත්මක ප්‍රශ්න සහ අභියෝග අභියෝග වර්ධනය වෙමින් තව තවත් සංකීර්ණ පැති සමාජය තුළ දිග හැරෙමින් පවතී.

පුවත් සිරස්තලවලින් ඔබ්බට සිතන්නට වෙර දරන ජනමාධ්‍යවේදීන්ට ලොවට හෙළිදරව් කිරීම සඳහා සහ අවබෝධ කර ගැනීම සඳහා ඕනෑ තරම් කතා පුවත් තිබේ. දුප්පත්කම යනු බොහෝ පැතිකඩයන් සහ විවිධ ලක්ෂණවලින් පිරුණු ඉතා වැදගත් තේමාවකි. විවෘත මනසකින් ඒ පිළිබඳ ගවේෂණය කරන්න !

# 3. දුගීබව නොදුටු සේ හැසිරෙන මාධ්‍ය කලාවේ දුගී බව

මාධ්‍ය විසින් දිළිඳුකම සම්බන්ධ ගැටලු නොසලකා හරිනු ලබන්නේ ශ්‍රී ලංකාවේ හෝ සංවර්ධනය වෙමින් පවතින රටවල පමණක් නොවේ.

බැංගලෝර් කතුවරියක සහ ස්වාධීන ජනමාධ්‍යවේදිනියක වන අම්මු ජෝශප් විසින් ඉන්දියාවේ මාධ්‍ය මඟින් දිළිඳුබව සහ සංවර්ධනය වාර්තා කරන ආකාරය පිළිබඳ දීර්ඝ කාලීනව නිරීක්ෂණය කර විග්‍රහයක් ඉදිරිපත් කර ඇත. 2007 වර්ෂයේ ඇය විසින් එරට ප්‍රවෘත්ති වාර්තාකරණය,මතුපිටට නිරාවරණ නොවූ කරුණු විශ්ලේෂණය කිරීමට වඩා කෙතරම් දුරට විවිධ උත්සව සහ සිදුවීම් වාර්තා කිරීමට සීමා වී ඇත්දැයි ලීවාය.

ගෝලීය ආර්ථික සමූහයේ අලුත් දරුවෙකු වන ඉන්දියාව දරිද්‍රතාවයේ විවිධ පැති අවබෝධ කරගැනීම පිණිස වසර ගණනාවක් තිස්සේ ප්‍රතිපත්ති සහ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට මුදල් විශාල ප්‍රමාණයෙන් වෙන් කර තිබිය දීත් කුසගින්න, මාතෘ මරණ සංඛ්‍යාව සහ දිළිඳුබවේ අනෙකුත් නිර්ණායකයන් රැසකින් ලොව ඉදිරියෙන්ම සිටින රට බවට පත් ව සිටින්නේ ඇයි ද යන්න ජනතාවට අවබෝධ කරලීම පිණිස ගවේෂණාත්මක මාධ්‍ය යොදා ගැනීමට ඕනෑ තරම් අවකාශයන් තිබේ.

"එසේම අපගේ පුවත්පත්වලට සහ 24×7 ප්‍රවෘත්ති වාර්තා කරන ප්‍රවෘත්ති නාලිකාවලට කොටස් වෙළඳපොළ, විදෙස් විනිමය අනුපාත සහ රන් රිදී අනුපාත, කාලගුණය, පරිසර දූෂණය ආදිය වාර්තා කිරීමට හැකි නම් නිසැක වශයෙන්ම ඔවුන්ට දිළිඳුකම පිළිබඳ විමසුමක්, සහස්‍ර සංවර්ධන ඉලක්කවල ප්‍රගතිය පිළිබඳ විමසුමක් මහජනතාවගේ අවබෝධය පිණිස ඉදිරිපත් කිරීමට හැකි විය යුතුය. සංවර්ධනයේ මෙම තීරණාත්මක අංශය සම්බන්ධයෙන් ඉන්දියාවේ කාර්ය සාධනය කවර මට්ටමක පවතින්නේ දැයි මහජන මතයක් පවා නිර්මාණය කළ හැකිය."[1]

මෙම ප්‍රවණතාවය දිළිඳුබව පිළිබඳ ඔවුන්ටම ආවේණික අභියෝග පවතින දියුණු රටවල පවා දැකිය හැකිය.

සිමොන් කූපර් විසින් 2013 වර්ෂයේ ෆයිනෑන්ෂල් ටයිම්ස් (එක්සත් රාජධානියේ) පුවත්පතට "poverty has never been sexy" (දුප්පත්කම කිසි විටෙක ආකර්ෂණීය මාතෘකාවක් බවට පත්ව නැතැයි) ලිවීය. 2008 වර්ෂයේ ජෝෂප් රොව්න්ට්‍රි පදනම විසින් බ්‍රිතාන්‍ය රූපවාහිනියෙහි පැය 40ක විකාශන කාලයක් විශ්ලේෂණය කිරීමෙන් අනාවරණය කරගනු ලැබුයේ 'දුප්පත්කම' යන වචනය දෙවරක් පමණක් භාවිතයට ගැණුනු බවයි. එම අවස්ථා දෙකද '*Shameless*' නම් ප්‍රහසන ටෙලිනාට්‍ය මාලාවක අඩංගුවිය. දිළිඳු ජනතාවට ගුවන් කාලයක් ලැබෙන විට එය නිතරම *Jerry Springer* වැනි වැඩසටහන්වල සමච්චලයට පාත්‍ර වන වස්තූන් ලෙස පමණක් විය.

[1] Is the media watching poverty enough? Ammu Joseph. *India Together.* 29 October 2007. http://indiatogether.org/medpov-op-ed

කුපර්ට අනුව අසමානතාවය පිළිබඳ බ්‍රිතාන්‍යයේ මාධ්‍යයන්හි ප්‍රබල විවාදයන් පැවතිය ද ඒවා කේන්ද්‍රගතව ඇත්තේ බොහෝ විට සමාජයේ 1%ක් වන පොහොසතුන් පිළිබඳවය. මාධ්‍ය තුළින් නිරූපිත බහුතරයක් පුද්ගලයින් කලාකරුවන්, ක්‍රීඩකයින් සහ බොහොමයක් දේශපාලනඥයන් වන අතර ඔවුන් මිලියනපතියන්ය. ඉතාමත් දුප්පත් පිරිස හඳුන්වන්නට භාවිතා කරනුයේ සමූහවාචී යෙදුම්ය.

ජනමාධ්‍යවේදීන් ඉතිහාසඥයන්ගෙන් උගත යුතු බව ඔහු තර්ක කරයි. ඉතිහාසඥයින් පරම්පරා ගණනාවකට පෙර සිටි රජවරුන් සහ රැජිණියන් පිළිබඳව තම අතිශය අවධානය අත හැරියේ පොදු ජනතාවගේ දෘෂ්ටිකෝණයෙන් ලිවීමටයි. දීර්ඝ කාලයක් තිස්සේ පීඩා විඳින කම්කරුවන් පරපුරක් අති මහත් අවමානයෙන් ගලවා ගැනීම පිණිස *The Making of the English Working Class* කෘතිය ලියූ බ්‍රිතාන්‍ය ඉතිහාසඥයෙකු සහ ලේඛකයෙකු වන ඊ.පී තොම්සන් (1924 - 1993) ඔහු උදාහරණයක් ලෙස ඉදිරිපත් කරයි.[2]

ඇමරිකා එක්සත් ජනපදයේ තත්ත්වය මීට වඩා වෙනස් නොවේ. නිල සංගණන සංඛ්‍යාලේඛනවලට අනුව  ඇමරිකානුවන් මිලියන 46.7ක් (15%කට ආසන්න) 2014 දී දුප්පත්කමින් පීඩා විඳින තත්ත්වයක් තුළ පවා බොහොමයක් ඇමරිකානු ජනමාධ්‍ය තුළ දේශීය හා ජාත්‍යන්තර දිළිඳුභාවය ප්‍රමාණවත් ගැඹුරකින් වාර්තා නොකෙරිණි.

2016 වසරේ මුල් භාගයේ කැලිෆෝනියානු සඟරාවකට සටහනක් තබමින් කේටියා සේවුක් සඳහන් කර ඇත්තේ "ජාකොබ් රීගේ *How The Other Half Lives"* ජේම්ස් ඇගීගේ *Let Us Now Praise Famous Men* සිට බාබරා ඒහ්රේන්රීච්ගේ *Nickel and Dimed* දක්වා දිළිඳුකම පිළිබඳ මාධ්‍යකරණයේ පොහොසත් සම්ප්‍රදායන්  පැවතුණ ද ඒ පිළිබඳ වාර්තා කිරීම තවමත් සෑහීමකට පත්විය හැකි මට්ටමක නොමැති බවයි. 2014 වර්ෂයේ 'ප්‍රවෘත්ති වාර්තාකරණයේ සාධාරණත්වය සහ නිවැරදිභාවය' නම් වූ ප්‍රගතිශීලි මාධ්‍ය නියාමන කණ්ඩායමක් සිදු කළ අධ්‍යයනයකින් ප්‍රධාන ප්‍රවෘත්ති නාලිකා තුනක් මාස 14ක කාලය තුළ තම වැඩසටහන් වලින් දරිද්‍රතාවය සඳහා වෙන් කර තිබුණේ 0.2%ක ප්‍රතිශතයක් පමණක් බව  සොයා ගෙන තිබුණි. ඒ හා සමානවම 'ජනමාධ්‍ය විශිෂ්ටතාව සඳහා වූ පිව් පර්යේෂණ මධ්‍යස්ථානය සිදුකළ පර්යේෂණයකදී අනාවරණය වූයේ ප්‍රධාන ධාරාවේ මාධ්‍ය ආයතන 52ක් 2007 වර්ෂයේ සිට 2012 මැද භාගය තෙක් තම පුවත් වලින් දිළිඳුකම පිළිබඳව වාර්තා කර තිබුණේ  1%ටත් වඩා අඩු ප්‍රතිශතයක් බවයි.

මාධ්‍ය සංවිධානවල දීර්ඝ කාලයක් තිස්සේ පවතින සම්ප්‍රදාය නම් ජනමාධ්‍යවේදීන් විසින් තමා ආවරණය කිරීමට කැමති ප්‍රවෘත්ති තේමා හෝ විශේෂාංගයන් පිළිබඳව කතුවරුන්ට යෝජනා කිරීමයි. මාධ්‍ය තුළ තම ප්‍රවෘත්තිය කෙරෙහි නිරන්තර ඉල්ලුමක් ඇති කරවන ලෙස, නව්‍ය, සත්‍යවාදී සහ ආකර්ෂණීය ආකාරයෙන් ප්‍රවෘත්තියක් ඉදිරිපත් කිරීම පිණිස නිර්මාණශීලිවීමේ අභියෝගයට මෙහිදී ජනමාධ්‍යවේදීහු මුහුණ දෙති.

බටහිර ජනමාධ්‍යවේදීන් විසින් මේ සඳහා යොදා ගන්නා එක් උපක්‍රමයක් නම් දිළිඳුබව පිළිබඳ කතා පුවත් ආර්ථික අසමානතාවය හා සම්බන්ධ පුළුල් ගැටලු හා සම්බන්ධ කිරීමයි. මන්ද එවැනි ගැටලු පිළිබඳව මධ්‍යම පන්තිය සැලකිල්ලක් දක්වන බැවිනි.

[2] Poverty's poor show in the media. Simon Kuper. *Financial Times*, UK. 29 March 2013. https://next.ft.com/content/6e8b7882-9672-11e2-9ab2-00144feabdc0

කැලිෆෝනියා විශ්වවිද්‍යාලයේ ජනමාධ්‍ය පිළිබඳ බර්ක්ලි පශ්චාත් උපාධි ආයතනයේ පීඨාධිපති එඩ්වඩ් වසර්මන් විසින් සිදු කළ නිරීක්ෂණයකට අනුව අවපාත තත්ත්වයක් දක්වා වර්ධනය වූ 2008 ආර්ථික අර්බුදය හේතුවෙන් සමාජ අසමානත්වය පිළිබඳ සිදු කරන ප්‍රවෘත්ති වාර්තාකරණයන් ඉහළ ගොස් තිබේ. 'නොවටිනා යැයි සමාජය විසින් සලකන දුප්පතුන් ' පිළිබඳව ජනතාව දැනගත්හ. සමාජ අසමානතාව පිළිබඳ යථාර්ථය බහුතර පාඨක ජනතාවට ස්පර්ශ වන තරම් මට්ටමට වර්ධනය වී තිබුණි.

මාධ්‍ය විසින් දිළිඳුබව පිළිබඳ ගැටලු වාර්තා කරන අවස්ථාවල එය නිතරම ඒකාකාරී ස්වරූපයක් ගන්නා අතරම මතුපිටින් සිදු කරන නොගැඹුරු වාර්තාවලින් සමන්විතය. දුප්පතුන් නිරූපණය කරනු ලබන්නේ විපතට පත්වූවන්, ගැටලු ඇති කරන්නන් සහ අනුන් මත යැපෙන්නන් ලෙසය.

සිමොන් කූපර් සඳහන් කරන පරිදි දුප්පතුන්ව විපතට පත් වූවන් ලෙස ඉදිරිපත් කරනු වෙනුවට, මැන්චෙස්ටර්හි සමාජ පර්යේෂිකාවක වන ඇමිනා ලොන් විසින් යෝජනා කරන ආකාරයේ වැඩ කරන පන්තියේ කාන්තාවන්පිළිබඳ සඟරාවල භාවිතා වෙන දුෂ්කරතාවයන් මැඩ ජයගත් අය පිළිබඳ කතා පුවත් අපට භාවිතා කළ හැකිය. ලිවර්පූල්හි ජීවත් වූ කොණ්ඩා සැකසුම් ශිල්පිනියක් විශ්වවිද්‍යාලය දක්වා යන ආකාරය තේමා කර ගත් චිත්‍රපටයක් වූ *Educating Rita* මේ සඳහා හොඳම උදාහරණයකි"

## ප්‍රවෘත්තියක් මතු කර ගැනීම සඳහා නිර්මාණාත්මක උපක්‍රම

2000 වර්ෂයේ දී නිව් යෝර්ක් ටයිම්ස් පුවත්පතේ මාධ්‍යවේදිනියක වන ටීනා රෝසන්බර්ග් විසින් එහි ඉරිදා සංග්‍රහයට ඒඩ්ස් වසංගතය හේතුවෙන් ලෝකයේම දිළිඳුතම රාජ්‍යයන්ට සිදුවන විපත පිළිබඳව ප්‍රවෘත්තියක් තෝරා ගන්නා ලදී. ඖෂධ සමාගම් විසින් සහරා සහ අප්‍රිකානු රජයන්ට බෙහෙත් ද්‍රව්‍යවලට ඇති ප්‍රවේශය ඇහිරීමට බලපෑම් කරන ආකාරය සහ ඒ හේතුවෙන් රෝගය සඳහා වන ප්‍රතිකාර රෝගීන්ට දරා ගත නොහැකි මට්ටමකට පත් වී තිබීම පෙන්වා දීමට ඇයට අවශ්‍ය විය. මෙම රටවල සෑම වැඩිහිටියන් 12දෙනෙකුගෙන් එක් අයෙකුටම ඒඩ්ස් වැළඳී ඇත.

ඇයගේ කතුවරයාගේ ප්‍රතිචාරය වූයේ, "මලාවිහි මිනිසුන් සියලූ දෙනා මිය යන්නේ කෙසේද යන්න පිළිබඳව තවත් වචන 7000ක් මගේ පාඨකයින්ට කියවන්නට සලස්වන්නට මට නොහැකිය" යන්නයි.

අධෛර්යයට පත් කරවන සුළු කතුවරයාගේ එම ප්‍රකාශයට පසුව රෝසන්බර්ග් ඇයගේ කතාව පළ කිරීම සඳහා මාර්ගයක් පාදා ගත්තාය. අර්බුදයට ලක්ව ඇති රටවල් පිළිබඳ ලියනු වෙනුවට ඖෂධ නිෂ්පාදකයින්ගෙන් ඇති වන පීඩනය වැළැක්වීමට හැකි වූ එක් රටක් වන බ්‍රසීලය පිළිබඳව ඇය ලිවුවාය. "ලෝකයේ ඒඩ්ස් අර්බුදය විසඳන්නේ කෙසේද" යන්න ප්‍රධාන ප්‍රවෘත්තිය බවට පත් විය. එමඟින් ඉතාම නරක තත්ත්වයන් අවධාරණය කළ නමුත් අපේක්ෂා සහගත විකල්පයන් ද ඉදිරිපත් කොට තිබුණි.

"කියවන්නන්ට එය ඉතාමත් සිත් ගන්නා සුලු වූවා මෙන් ම ඉතාමත් බලපෑම් සහගත වූවා," යැයි පසුව රෝසන්බර්ග් විසින් ප්‍රකාශ කර තිබේ. ඇය පසුකාලීනව සමාජ ගැටලු පිළිබඳ ප්‍රතිචාර වාර්තා කිරීම සඳහා දිරි ගන්වන විසඳුම් ප්‍රවෘත්තිකරණ ජාලයේ සම නිර්මාතෘ වූවාය.

**SOURCE :** http://alumni.berkeley.edu/california-magazine/just-in/2016-04-06/poor-journalism-media-coverage-poor-getting-better-or-worse

# 4. දිළිඳුබව අවබෝධ කර ගැනීම : දළ විශ්ලේෂණයක්

දිළිඳුකම විවිධ ස්වරූපයෙන් අවබෝධ කර ගත හැකිය. ඇගයිය හැකිය. ඉන් එක් ක්‍රමයක් වන්නේ සංඛ්‍යා දත්ත සහ ඒවායෙහි විශ්ලේෂණයන් තුළින් පහසුවෙන් ගොඩ නගා ගත හැකි දළ විශ්ලේෂණයක් තුළිනි.

දිළිඳුකම අධ්‍යයනයට වෙන් වූ පුළුල් අධ්‍යයන ක්ෂේත්‍රය පිළිබඳ කෙටි සමාලෝචනයක් මෙම කොටසෙහි ඉදිරිපත් කෙරේ.

## දිළිඳුකම මනිනු ලබන්නේ කෙසේ ද?

දිළිඳුකම අවබෝධ කර ගැනීම පිණිස හුදෙකලා ප්‍රවේශයක් නැත. එසේම එය ඇගයීම සඳහා තනි නිර්ණායකයක් ද නැත. දිළිඳුකම යනු බොහෝ මානයන් සහිත සංකීර්ණ ප්‍රපංචයකි.

දිළිඳුබව අර්ථ නිරූපණය කිරීම, ඇගයීම සහ සමාලෝචනය කිරීම සඳහා පර්යේෂකයෝ ප්‍රධාන ප්‍රවේශ හතරක් භාවිතා කරති. මූල්‍යමය ප්‍රවේශය, ශක්‍යතා ප්‍රවේශය, සමාජ බහිෂ්කරණ ප්‍රවේශය සහ සහභාගීත්ව ප්‍රවේශය එම ප්‍රවේශ හතරයි.

- මූල්‍යමය ප්‍රවේශයෙන් අවධානය යොමු කරනු ලබන්නේ ආදායම සහ වියදම වැනි දිළිඳුකම පිළිබඳ ආර්ථික මානයන් පිළිබඳවය.
- ඉන්දියානු ආර්ථික විශේෂඥයෙකු සහ නොබෙල් සම්මානලාභියෙකු වන අමාත්‍ය සෙන් විසින් හඳුන්වා දුන් ශක්‍යතා ප්‍රවේශය තුළින් යහපත් ජීවිතයක් සඳහා පවතින මාදිලින් කෙරෙහි අවධානය යොමු කරනු ලැබේ. පුද්ගලයෙකුට ඔහු හෝ ඇය විසින් අගය කරන කරනු ලබන ආකාරයේ ජීවිතයක් තිබේද? සෞඛ්‍ය, අධ්‍යාපනය, පරිසරය සහ සවිබලගැන්වීම වැනි මූලික මට්ටමේ හැකියාවන් ඇයට ළඟා කර ගත හැකි ද? එසේ නැතිනම් හොඳ ජීවිතයක් ගත කිරීමට ඇති හැකියාවන් අහිමි වීම දිළිඳුකම ලෙස හඳුන්වනු ලැබේ.
- සමාජ බහිෂ්කරණ ප්‍රවේශය මගින් සමහර පුද්ගලයින් සමාජීය වශයෙන් වෙනස් ලෙස සලකනු ලැබීම හා බැහැර කිරීම හඳුනා ගනු ලබයි. එහි ප්‍රතිඵලයක් ලෙස ඔවුහු තීරණය ගැනීමට, සිවිල්,සමාජයීය සහ සංස්කෘතික ජීවිතයට සම්පූර්ණ වශයෙන් සහභාගී වීමට අපොහොසත් වෙති.
- සහභාගීත්ව ප්‍රවේශය මිනිසුන්ගේ සංජානනයන් මත පදනම් වී ඇත. එබැවින් එය විෂය මූලික වේ.

'කායික යහපැවැත්ම සඳහා අවශ්‍ය අවම අවශ්‍යතාවයන්ට වඩා පහළින් පැවැත්ම' අන්ත දුගීභාවය ලෙස විස්තර කෙරේ. බොහෝ විට එය මනිනු ලබන්නේ අවම පරිභෝජන අවශ්‍යතාවයන් ප්‍රමාණයක් සපුරා ගැනීමට කුටුම්භයකට ඇති හැකියාවෙනි.

සාපේක්ෂ දිළිඳුභාවය යනු ජාතික ආදායම හෝ වියදම් මට්ටමේ සාමාන්‍යයට පහළින් ඇති ආදායම් හෝ පරිභෝජන මට්ටම්ය.

දිළිඳුබව පිළිබඳ පර්යේෂණ සිදු කරන පර්යේෂකයෝ වෙනස් වර්ගීකරණ දෙකක් හඳුනා ගනිති. දුප්පත් කමින් පෙළෙන ජනතාව (නිධන්ගත දිළිඳුබව), සහ පහසුවෙන්ම දුප්පත්කමට ලක් විය හැකි ජනතාව (වෙනස්වන සුළු සහ ආසන්න දිළිඳු) වශයෙනි.

## දරිද්‍රතා රේඛාව යනු කුමක් ද?

> 2016 ජූලි වන විට ශ්‍රී ලංකාව සඳහා නිල දරිද්‍රතා සීමාව එක් පුද්ගලයෙකුට මාසයකට රු.3,937ක්ව පැවතිණි. කෙසේ නමුත්, මේ තුළින් ආවරණය කෙරනුයේ දරිද්‍රතාවයේ ආර්ථික පරිමාණයන් (ආදායම් හා වියදම්) පමණක් වන අතර සෞඛ්‍ය, අධ්‍යාපනය, සමාජ සබඳතා සහ පාරිසරික ගැටලු අත්හැර දමා තිබේ.

දරිද්‍රතා රේඛාව යනු නිල අවශ්‍යතාවයන් සඳහා ආර්ථික දිළිඳුකම ගණනය කිරීම සඳහා දරනු ලැබූ උත්සාහයකි. එනම් කිසියම් රටක පුද්ගලයෙකුට ජීවත් වීම සඳහා ප්‍රමාණවත් යැයි සැලකෙන අවම ආදායම් මට්ටමයි.

2016 ජූලි වන විට ශ්‍රී ලංකාව සඳහා නිල දරිද්‍රතා සීමාව සීමාව එක් පුද්ගලයෙකුට මාසයකට රු.3,937ක්ව පැවතිණි. කෙසේ නමුත්, මේ තුළින් ආවරණය කෙරනුයේ දිළිඳුභාවයේ ආර්ථික පරිමාණයන් (ආදායම් හා වියදම්) පමණක් වන අතර සෞඛ්‍ය, අධ්‍යාපනය, සමාජ සබඳතා සහ පාරිසරික ගැටලු අත්හැර දමා තිබේ.

දරිද්‍රතා රේඛාව ගණනය කිරීම සඳහා භාවිතා කරන ප්‍රධාන දත්ත මූලාශ්‍රය වන්නේ වසර තුනකට වරක් ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවෙන් සිදු කරන ගෘහ ඒකක ආදායම් සහ වියදම් සමීක්ෂණයයි. අවසන් වරට එම සමීක්ෂණය සිදු කළේ 2012/13 වර්ෂයෙහිය.

ඒක පුද්ගල මාසික සැබෑ වියදම නිල දිළිඳුකමේ සීමාවේ වටිනාකමට වඩා අඩු නම් එකී පුද්ගලයා දිළිඳුකමින් පෙළෙන බවට සැලකේ. මෙම ක්‍රමවේදය භාවිතා කරමින් දෙපාර්තමේන්තුව විසින් ශ්‍රී ලංකාවේ 2012/13 සඳහා දරිද්‍රතා දර්ශක අගය 6.7%ක් බවට ප්‍රකාශ කරන ලදී. නැතහොත් එය මිලියන 1.3 ජනතාවක් විය.[3] කෙසේ නමුත් දරිද්‍රතා විශ්ලේෂණ කේන්ද්‍රයේ විශ්ලේෂණවලට අනුව දරිද්‍රතාවය මූල්‍යමය හෝ නිරපේක්ෂ මිනුම්වලට සීමා කිරීම ප්‍රමාණවත් නොවන අතර නොමඟ යවන සුලුය.

උදාහරණයක් ලෙස දත්තවලට අනුව වතු අංශයේ ආදායම් දරිද්‍රතාව මෑත වර්ෂවල සැලකිය යුතු ලෙස පහත වැටී ඇත. කෙසේ නමුත්, වතුකර ජනතාව බොහොමයකට තවමත් සැලකිය යුතු මට්ටමකින් අධ්‍යාපනය, ජලය සහ සනීපාරක්ෂක පහසුකම් සහ නිවාස පහසුකම්වලට ප්‍රවේශයක් නැත. වෙනත් අයුරකින් කිවහොත් ඔවුහු දුප්පත්කමින් පීඩා විඳිති.

2016 අප්‍රියෙල් මස දරිද්‍රතා විශ්ලේෂණ කේන්ද්‍රය විසින් තර්ක කරන ආකාරයට දුප්පත්කමේ සියලුම මානයන්ගෙන් එය ඇගයීමට ලක් කරන විශ්වසනීය සහ නිවැරදි මිම්මක් අවශ්‍ය වේ. දුප්පතුන්, ආසන්න වශයෙන් දිළිඳුභාවයෙන් පෙළෙන්නන්, සමෘද්ධි වැනි දිළිඳුකම තුරන් කිරීමේ වැඩසටහන්, දුප්පතුන් සඳහා වන (අනෙකුත්) දීමනා, වැඩිහිටියන් සහ ආබාධිත පුද්ගලයින් වැනි අනාරක්ෂිත කණ්ඩායම් නියෝජනය කිරීම පිණිස එවැනි මිම්මක පූර්ව අවශ්‍යතාවයක් පවතී. මූල්‍යමය ප්‍රවේශය වැනි තනි මානයක් පමණක් පදනම් කර ගැනීම තුළින් දිළිඳුකම මැනිය හැකි අනෙකුත් (බහු මානීය) පැති නොසලකා හැරෙන අතර එමඟින් දිළිඳුකමින් පෙළෙන හා නොසලකා හැරීම්වලට මුහුණ දෙන පිරිස්වලට බලපාන පුළුල් ගැටලු ග්‍රහණය කර ගැනීමට අපොහොසත් වේ. [4]

[3] ගෘහ ඒකක ආදායම් සහ වියදම් සමීක්ෂනයෙහි දරිද්‍රතා නිර්ණායක http://www.statistics.gov.lk/poverty/PovertyIndicators2012_13.pdf | [4] http://www.cepa.lk/publications/details/who-are-the-poor-more-than-one-way-of-understanding-poverty-- f47e5fe0ca450d78e0226c36474c479e.html

**දත්ත මූලාශ්‍රයන්:** ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තු වෙබ් අඩවිය: http://www.statistics.gov.lk/page.asp?page=Poverty
දකුණු ආසියානු ලෝක බැංකුව: http://www.worldbank.org/en/region/sar
එක්සත් ජාතීන්ගේ සංවර්ධන අරමුදල ශ්‍රී ලංකාව සඳහා වූ මානව සංවර්ධන වැඩසටහන: http://hdr.undp.org/en/countries/profiles/LKA

# 5. දිළිඳුබව අවබෝධ කර ගැනීම : සවිස්තරාත්මක විශ්ලේෂණයක්

වර්තමාන සමාජයේ බොහෝ අනෙකුත් සාධක මෙන් ම දිළිඳුකම ද සංකීර්ණ සංකල්පයකි. ජාතික මට්ටමේ සංඛ්‍යාලේඛන උපයෝගි කර ගෙන සිදු කරන දළ විශ්ලේෂණයක් ප්‍රයෝජනවත් නමුත් දිළිඳුකමේ විවිධ වෙනස්කම් අවබෝධ කර ගැනීමට එය ප්‍රමාණවත් නොවේ.

ජාතික මට්ටමේ සිත් ඇදගන්නා සුලු සමහර සංඛ්‍යාලේඛන තුළින් පළාත් සහ දිස්ත්‍රික් මට්ටමින් පවතින දරිද්‍රතා විෂමතාවයන් සැඟවිය හැකි මෙන්ම නොසලකා හැරිය හැකිය. ඉතා සියුම් ලෙස සිදු කරන ලද දත්ත විශ්ලේෂණයක් තුළින් පැහැදිලි වනුයේ ශ්‍රී ලංකාවේ සියලුම ප්‍රදේශ පසුගිය දශක දෙකක කාලය තුළ සමාන ලෙස ප්‍රගතියක් අත්පත් කර ගෙන නැති බවයි.

උදාහරණයක් ලෙස බොහොමයක් දිස්ත්‍රික්ක දැනටමත් ආදායම් දිළිඳුකම හරි අඩකින් අඩු කර ගෙන ඇතත් එසේ නොවන අවස්ථා ද තිබේ. මේ යටතට ඊට පෙර වසර හා සැසඳීම සඳහා දත්ත සපයා ගත නොහැකි උතුරු සහ නැගෙනහිර පළාත්වල දිස්ත්‍රික්ක අටක් ඇතුළත් වේ. ඇත්ත වශයෙන්ම කිවහොත් ඌව පළාතේ මොණරාගල දිස්ත්‍රික්කයේ දුප්පත්කම පසුගිය වසර කිහිපය තුළ ඉහළ ගොස් තිබේ.

ඒ හා සමානවම ශ්‍රී ලංකා ජනගහනයෙන් 4.4%ක් ජනයා ජීවත් වන වතුකර වැවිලි ක්ෂේත්‍රයේ මානව සංවර්ධන නිර්ණායක රැසක් පහළ මට්ටමේ පවතී. උදාහරණයක් ලෙස නාගරික සහ ග්‍රාමීය ප්‍රදේශවල ජනතාව ආසන්න වශයෙන් 90%කට සෞඛ්‍යාරක්ෂිත පානීය ජලය ලබා ගැනීමට හැකියාව පවතින විට වතුකරයේ එය 46.3%කි.

සමහරුන් සිතනුයේ දිළිඳුකම යනු බොහෝ විට නැතහොත් මුළුමනින් ග්‍රාමීයව පවතින්නක් ලෙසයි. මෙය නිවැරදි නොවේ. මන් ද යත්, ඊටම ආවේණික තත්ත්වයන් සහිත නාගරික දුප්පත්කම ද පවතින බැවිනි. දුප්පත්කම කිනම් ප්‍රදේශයක කිනම් ස්වරූපයකින් පැවතිය ද ඒ පිළිබඳ අධ්‍යයනය හා ප්‍රතිචාර දැක්වීම අනිවාර්යයෙන් සිදු කළ යුක්තකි.

දිළිඳුබව පිළිබඳව ශාස්ත්‍රීය වශයෙන් හෝ ජනමාධ්‍යමය වශයෙන් අධ්‍යයනය කිරීම කළ යුත්තේ එක් මොහොතක සිදු කරන්නක් ලෙස නොවේ. එය සිදු කළ යුත්තේ කාලයක් තිස්සේ සිදු කරන දෙයක් වශයෙනි. ඒ මන්ද යත් වෙනස් වන තත්ත්වයන් සමඟ කිසියම් පවුලක් දුප්පත්කමට ඇද වැටීම හෝ ඉන් ගොඩ ඒම සිදු විය හැකි බැවිනි.

ඉතාමත් මෑත කාලීනව පළ වූ ලිපියක් තුළින් දරිද්‍රතා විශ්ලේෂණ කේන්ද්‍රය තර්ක කරනුයේ:

"දිළිඳුකම තක්සේරු කිරීම සඳහා විශ්වසනීය දත්ත කේන්ද්‍රීය සාධකයක් වන නමුත් කාලයත් සමග ප්‍රසාරණය වන දත්තවල අවශ්‍යතාවය දිළිඳුකම මැනීමේදී අවශ්‍ය වේ. උදාහරණයක් ලෙස වසර ගණනාවක් පුරා එකම නිවස සමීක්ෂණයට ලක් කෙරෙන ආකාරයේ දිගුකාලීන සමීක්ෂණ නිධන්ගත සහ වෙනස්වනසුලූ දුප්පත්කම හඳුනා ගැනීම

සඳහා අත්‍යාවශ්‍ය වේ. තවත් පැහැදිලි කරන්නේ නම්, දුප්පත්කමින් පෙළෙන පුද්ගලයින් සංඛ්‍යාව 2005-2010 කාලය තුළ අඩු වී ඇතැයි දත්තවලින් පෙන්නුම් කෙරුණ ද සැලකිය යුතු පුද්ගලයින් සංඛ්‍යාවක් තවමත් දිළිඳුකමේ රේඛාවට ඉහළින් පා වෙමින් සිටින අතර ඔවුන් අතුරින් අවදානම් තත්ත්වයේ සිටින සැලකිය යුතු පිරිසක් කුටුම්භ මට්ටමේ හෝ ප්‍රජා මට්ටමේ හදිසි තත්ත්වයන් හේතුවෙන් නැවතත් දිළිඳු බවට පත් විය හැකිය. එනම් කුටුම්භයෙහි ආදායම් උපයන සාමාජිකයාගේ මරණයක් හේතුවෙන් හෝ ස්වභාවික විපතක් හෝ අත්‍යවශ්‍ය භාණ්ඩ ද්‍රව්‍යවල මිල ඉහළ යාම වැනි බාහිර කම්පනයක් හේතුවෙන් එසේ විය හැකිය."[5]

එවැනි දීර්ඝ කාලීන අධ්‍යනයන් දුප්පතුන්ගේ විවිධ වර්ගීකරණයන් හඳුනා ගැනීම සඳහා වැදගත් වේ.

- දිළිඳුභාවයට සහ ඉන් පිටතට ගමන් කරන වෙනස්වනසුලු දිළින්දන්
- අවිධිමත් ශ්‍රම ක්ෂේත්‍රයේ වැඩකරන අදෘශ්‍යමාන දිළින්දන්
- කාන්තාවන් ගෘහ මූලිකත්වය දරන කුටුම්භ
- වැඩිහිටියන් (වයස අවුරුදු 60ට වැඩි අය, ජනගහනයෙන් 13%ක් වන මෙම පිරිස තවදුරටත් වැඩි වෙමින් පවතී)
- නිවාස නොමැති අය සහ
- නිල දරිද්‍රතා සංගණනයෙන් "මග හැරෙන" අනෙකුත් අවදානම් කණ්ඩායම්

දිළිඳුභාවයේ සහ දුප්පතුන්ගේ මෙවැනි වෙනස් මානයන් සහ වර්ගීකරණයන් ග්‍රහණය කර ගත හැකි කාලාන්තරයක් තිස්සේ එක්රැස් කරන ලද දත්ත මූලාශ්‍ර ශ්‍රී ලංකාවේ දැනට නොපවතී. එබැවින් දිළිඳුකම අවම කිරීමේ වැඩසටහන්වලින් මෙම දුප්පතුන් කාණ්ඩයන් අඩුවෙන් ආවරණය විය හැකිය.

## අපූරු ප්‍රායෝගික උදාහරණයක් : ශ්‍රී ලංකාව : රටවල් තුනක කතාවක්

ජනමාධ්‍යවේදීන්ට සංඛ්‍යාලේඛන භාවිතා කළ හැකිය. නමුත් සංඛ්‍යාවලින් සහ විද්වතුන්ගේ අර්ථ දැක්වීම් තුළින් මෝහනයට ලක් නොවීමට ඔවුන් වගා බලා ගත යුතුය. සාධනීය ජනමාධ්‍යවේදය තුළ අනුමාන සෝදිසි කිරීම් සහ විමර්ශනයන් අන්තර්ගත වේ. ඉචිලන් (*Echelon*) ව්‍යාපාරික සඟරාවේ මෑතක පළ වූ කවරයේ කතාවකින් (2016 අප්‍රියෙල්) මේ සඳහා හොඳ නිදර්ශනයකි.

"ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තුමේන්තුවේ දරිද්‍රතාවය පිළිබඳ ඇස්තමේන්තුවලට අනුව නිල වශයෙන් දිළිඳුකමින් පෙළෙනුයේ ශ්‍රී ලාංකිකයන් 6.7%ක් පමණි.කෙසේ නමුත්, දරිද්‍රතාවය පිළිබඳ මෙම නිර්වචනය අතිශයින් නොමග යවන සුලු සහ අදාළ නොවන්නකි. මන්ද යත්, ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ ඇස්තමේන්තුවට අනුව පුද්ගලයෙකුට දරිද්‍රතා සීමාවට ඉහළින් සිටීම සඳහා ඉපයිය යුත්තේ රු.3,930ක් නැතහොත් සිව් දෙනෙකුගෙන් යුත් පවුලකට නම් එය රු.15,720ක් පමණි.දිවයිනේ දුප්පත්ම කලාපයන්ගෙන් එකක සිටින අයෙක් වුවත්, සිව් දෙනෙකුගෙන් යුත් පවුලක් සඳහා රු.15,720කින් මූලික අවශ්‍යතා සපුරා ගැනීමට හැකි වෙතැයි නොසිතනු ඇත."

කුටුම්භ ආදායම් දත්ත පවතින විට විශ්වසනීය දරිද්‍රතා අනුපාතයක් ගණනය කිරීම අපහසු නොවන බව ලිපියෙන් තර්ක කරනු ලබයි. නමුත් නිවැරදි ප්‍රමිතීන් භාවිතා කිරීම තීරණාත්මකය :"ශ්‍රී ලංකාව දැන් මධ්‍යම ආදායම් ලබන රටක් වන අතර උප සහරානු අප්‍රිකානු රටවලට අදාළ දරිද්‍රතා මිනුම්දඬුවලින් ලංකාවට ප්‍රයෝජනයක් නැත."

මධ්‍යම ආදායම් ලබන රටවල දරිද්‍රතාවය තක්සේරු කරනුයේ ඇමරිකානු ඩොලර් 2.50ට වඩා අඩු (2005 දී ක්‍රය ශක්ති සාම්‍යය) හෝ දිනකට ඇමරිකානු ඩොලර් 4ක ආදායමක් ලබන වශයෙනි. මෙම මධ්‍යම ආදායම් දරිද්‍රතා රේඛාවන් ද්විත්වයේ (2012/13) මිල ගණන්වලට අනුව එක් පුද්ගලයෙකු විසින් මාසිකව උපයන රු.6,058කට සහ රු.9,692ක ආදායමකට සමාන වේ.

"මධ්‍ය ආදායම් ලබන රටවල පරිභෝජන කඩඉම් භාවිතා කර දරිද්‍රතාව තක්සේරු කළහොත් ශ්‍රී ලංකාවේ ජනගහනයෙන් 65%ක් දුප්පතුන්ය යන්න ලිපියෙන් තර්ක කෙරේ."

මෙතුළින් යමක් අනාවරණය කෙරුණ ද කණගාටුදායක තත්ත්වයක් නොවේ. කෙසේ නමුත්, හිංසනය,දුෂ්කරතා සහ දරිද්‍රතාවය යනාදිය හේතුවෙන් මිනිසුන්ගේ සිහින දැකීමේ හැකියාව හීන වී නොමැත. කලාපයේ (දකුණු ආසියානු) බොහොමයක් දුප්පත් මිනිසුන්ට වඩා අනාගතය පිළිබඳ උසස් අපේක්ෂාවන් ඔවුන්ට ඇත.

ආදායම් දරිද්‍රතාවය, ඒ සඳහා හේතු සහ එහි බලපෑම මත පදනම්ව දිවයිනේ පවතින වෙනස් ශ්‍රී ලංකාවන් තුනක් වටා සීමාවන් ඇඳිය හැකි බව ලිපියෙන් පෙන්වා දෙයි. සියලුම ශ්‍රී ලාංකිකයන් උසස් ජීවන මට්ටමකට ඔසවා තැබීමේ දී අවශ්‍ය වන ආර්ථික සංවර්ධනයේ සහ සමාජ සංවර්ධනයේ අභියෝග විශේෂඥයින් නොවන පාඨක පිරිසකට තේරුම් ගැනීම සඳහා ජනමාධ්‍ය ආඛ්‍යානයක් කෙසේ සහය වන්නේ ද යන්නට මෙය හොඳ උදාහරණයකි.

සම්පූර්ණ ලිපිය අන්තර්ජාලයේ කියවීම සඳහා : http://echelon.lk/home/sri-lanka-a-tale-of-three-countries/

# 6. දිළිඳුබව වාර්තා කිරීම: සංවර්ධන ජනමාධ්‍යකරණයේ අභියෝග



ටාසි විට්ටච්චි

1960 දී පමණ බිහි වූ සංකල්පයක් වන 'සංවර්ධන ජනමාධ්‍යවේදය' බොහෝ විට රජයන් විසින් සිදු කරනු ලබන සංවර්ධන වැඩසටහන් සඳහා මාධ්‍ය සහයෝගය ලබා ගැනීමේ ක්‍රමයක් වශයෙන් 1970 වන විට පුළුල් ලෙස ප්‍රචලිත විය.

නමුත් සංවර්ධනයේ නාමයෙන් රජය විසින් සිදු කරන සෑම දෙයක්ම අවිචාරවත් ලෙස වාර්තා කිරීමට රජය සහ මාධ්‍ය වෘත්තිකයින් කටයුතු කිරීම හේතුවෙන් පසුකාලීනව එම යෙදුමට නරක නාමයක් අත් පත් විය.

උදාහරණයක් ලෙස 1970 සහ 1980 කාලය තුළ මහවැලි සංවර්ධන ව්‍යාපෘතිය ප්‍රශ්න කිරීමට හෝ විවේචනය කිරීම සඳහා ශ්‍රී ලාංකීය මාධ්‍ය අවකාශය තුළ පැවතියේ සීමිත ඉඩකඩකි. අද, එතුළින් ප්‍රතිලාභ මෙන්ම අහිතකර ප්‍රතිඵල ද මතු වී ඇති බව පිළිගැනේ.

කීර්තිමත් ලාංකීය ජනමාධ්‍යවේදියෙකු සහ කතුවරයෙකු වන ටාසි විට්ටච්චි (1921-1993) මුල් කාලීනව සංවර්ධන ජනමාධ්‍යවේදය ප්‍රවර්ධනය කළ අයෙකි. ඔහු එය දුටුවේ සිරස්තලවලට පාදක වන සිද්ධීන්ගෙන් එහා ගොස් බලපෑමට ලක් වූ ජනතාව හා ක්‍රියාවලීන් අවබෝධ කරගැනීමක් ලෙසයි. "අවාසනාවට, එම යෙදුම පසු කාලීනව විවිධ රජයන් විසින් තම රටවල සිදුවන හොඳ දේවල් පමණක් වාර්තා කොට සියලුම නරක දේවල් බැහැර කිරීමට භාවිතා කරනු ලැබූ බව" ඔහු වසර ගණනාවකට පසුව සඳහන් කළේය.

ටාසි විට්ටච්චි යටතේ පුහුණුව ලැබූ සහ ඔහු තුළින් අභිප්‍රේරණය ලද ආසියානු ජනමාධ්‍යවේදීන් අතුරින් අයෙකු වන නේපාල කතුවර කුන්ඩා-ඩික්සිත් මේ කියමන සමග එකග වෙයි. ඔහු සඳහන් කරන පරිදි 'සංවර්ධන ජනමාධ්‍යවේදය' අතිශය සාමාන්‍ය ලෙස මාධ්‍යකරණයේ යෙදෙන මාධ්‍යයන්හි අවසාන පිහිට බවට පත් විය. තුන්වෙනි ලෝකයේ බොහෝ ජනමාධ්‍යවේදීන් විසින් තුන්වෙනි මට්ටමට වැටීමට නිදහසට කරුණක් ලෙස එය භාවිතා කරනු ලැබිණි.

එමෙන්ම සංවර්ධනය පිළිබඳ වාර්තා කිරිමේ දී ජලජීවී වගාව හෝ ප්‍රාථමික සෞඛ්‍යාරක්ෂණය වැනි සාමාන්‍යයෙන් නීරස විෂයයන්ට ජීවය පොවනු වෙනුවට කතුවරුන්ගේ දෑස් යොමු වී තිබුණේ 'සංවර්ධනය' යන වචනය වැඩියෙන් සඳහන් කිරීමටය. එකම ජනප්‍රිය යෙදුම් ගොන්නක් භාවිතා කරමින් එක්සත් ජාතීන්ගේ වාර්තාවන් අභියෝගයට ලක් කරමින් ඔවුන් විසින් එවැනි ප්‍රවෘත්තා වාර්තා අවසන් කොට තිබුණි.

එහෙත් සංවර්ධන ජනමාධ්‍යවේදය යනු කිසිසේත්ම ප්‍රමිතියෙන් තොර, අලස හා නොසැළකිලිමත් මාධ්‍යකරණයකට අවසරයක් නොවේ.. සැබෑ වශයෙන් ම දිළිඳුකම සහ සංවර්ධනයේ ගැටලූ වාර්තා කිරීම සඳහා ප්‍රවෘත්තිකරණයේ සියලූම මූලධර්ම භාවිතා කළ හැකිය. මෙම උදාහරණයේ දී එවැනි ප්‍රවෘත්ති ආවරණය කරන ජනමාධ්‍යවේදීන්ට සහකම්පනය, පරිකල්පනය සහ ලාලසාවක් පවතී නම් යහපත් මාධ්‍යකරණයක නිරත විය හැකිය.

විට්ටච්චි විසින් ජනමාධ්‍යවේදීන්ට නිතරම සිහිපත් කරන දෙයක් වන්නේ 'ප්‍රවෘත්තියට පිටුපස ඇති ප්‍රවෘත්තිය' වඩා වැදගත් වන බවයි. ඉතාමත් ප්‍රචලිත උදාහරණයක් වන ගොවීන්ගේ සිය දිවි නසා ගැනීම් තුළින් ඩික්සිත් මෙය පැහැදිලි කරයි.

ඉන්දියාවේ ගොවීන් සිය දිවි නසා ගැනීම් පිළිබඳ පුවත් වසර ගණනාවක සිට ප්‍රධාන සිරස්තල බවට පත් ව තිබුණි. 2014 වර්ෂයේ දී ගොවීන් 5,650ක් සිය දිවි නසා ගෙන තිබුණි. වැඩිම සිය දිවි නසා ගැනීම් ප්‍රමාණයක් වාර්තා වුණේ 2004 වර්ෂයේය. ගොවීන් 18,241ක් එම වසරේ සිය දිවි නසා ගෙන තිබුණි. පර්යේෂකයින් සහ ක්‍රියාකාරීන් විසින් මේ සඳහා මෝසම් වැසි නොලැබීම, ඉහළ ණය බර, රජයේ අහිතකර ප්‍රතිපත්ති, මානසික සෞඛ්‍ය ගැටලූ සහ පවුල් ප්‍රශ්න වැනි නානාවිධ හේතු ඉදිරිපත් කර තිබුණි.

ඩික්සිත්ගේ *Dateline Earth: Journalism as if the planet mattered (IPS Asia Pacific, 2010)* කෘතියෙන් ඩික්සිත් විසින් පෙන්වා දෙනුයේ දහස් ගණන් කපු පුලුන් ගොවීන් සිය දිවි නසාගෙන තිබුණේ මිල ගණන් පහත වැටීම සහ ණයගැතිභාවය හේතුවෙන් බවයි. නමුත් සෑම සිය දිවි නසා ගැනීමක් ම වාර්තා කර තිබුණේ අපරාධ රැල්ලේ එක් සිද්ධියක් ලෙස මිස ප්‍රවණතාවයක් ලෙස නොවේ. සිය දිවි නසා ගැනීම්වලට හේතූන් විශ්ලේෂණය කර තිබුණේ ඉතාමත් කලාතුරකිනි. සිද්ධියේ සන්දර්භය හාරා ඇවිස්සීමට කෙතරම් දුරට ජනමාධ්‍යවේදීන් කැමැත්තෙන් පසුවේද? කෙතරම් දුරට ඉඩ ලැබී ඇත්ද? ප්‍රවෘත්තිය තෝරා ගැනීම සිදු කරන්නේ කව්ද? ප්‍රවෘත්ති තෝරා ගැනීමේ නිර්ණායක මොනවාද? සමාජ සාධාරණත්වයේ තරාදිය පොහොසතුන් සහ බලය ඇත්තවුන් දෙසට නැමෙන සමාජයක, විෂය මූලික වීම පවතින තත්ත්වය දිගින් දිගටම පැවතීමකි. එය පක්ෂග්‍රාහී වීමකි. එය දුප්පතුන්ට සහ මග හැරුණු කොටස් වලට එරෙහිව සිදු කරන්නකි. සමාජයේ අධිපති කණ්ඩායම්වලට පමණක් වැදගත් ගැටලූ වාර්තා කිරීමේ දී අපි අපක්ෂපාතී නොවන්නෙමු. එබැවින් විෂය මූලිකත්වයට සටන් කරනු වෙනුවට අප සාධාරණ වීම අවශ්‍ය වනු ඇත.

ඩික්සිත් සඳහන් කරන ආකාරයට මාධ්‍ය විසින් ප්‍රවෘත්ති සඳහා ප්‍රවේශ වන ආකාරයෙහි මූලික වෙනසක් අවශ්‍ය වේ. "ජනමාධ්‍යවේදීන් විසින් දිළිඳුකම සහ සමාජ අසාධාරණත්වයෙහි බලපෑම් පමණක් නොව ඒවාට හේතු ද වාර්තා කිරීමට උත්සාහ කළ යුතුය. එහි අර්ථය නම් අසාධාරණ ලෝකයක සාධාරණ වීමට උත්සාහ දැරීම තුළින් අප සෑම කෙනෙකුම සතු හෘදය සාක්ෂිය භාවිතා කිරීමයි "

## සිද්ධි අධ්‍යයනය 1 :
## ජනමාධ්‍ය සහ මත්ද්‍රව්‍ය : මාධ්‍යයෙහි සම්බන්ධතා ගවේෂණය කරනුයේ කෙසේ ද?

ලෝක දුම්වැටි විරෝධී දිනය සනිටුහන් කරමින් පැවැති උත්සවයක් අමතමින් 2016 මැයි 31 දින ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා ඉහළ යන දුප්පත්කමට සහ දිළිඳු ජනතාවගේ සෞඛ්‍ය පිරිහීමට හේතුවනවා යැයි සඳහන් කරමින් දුම්කොළ සහ මත්පැන් භාවිතයට චෝදනා එල්ල කරනු ලැබීය.

ප්‍රවෘත්ති වාර්තාවලට අනුව, ජනාධිපතිවරයා සඳහන් කළේ ශ්‍රී ලංකාවේ දිනකට දුම්වැටි සහ මත්පැන් වෙනුවෙන් රුපියල් මිලියන 500ක් වැයකරන බවත් අඩු ආදායම් ලබන ජනතාව තම ආදායමෙන් 35%ක් මේ වෙනුවෙන් වියදම් කරන බවත්ය. වැඩි දුරටත් ඔහු සඳහන් කළේ දුම්වැටි සහ මත්පැන් කර්මාන්තය සහ ඒවා භාවිතය සම්බන්ධයෙන් රජය විසින් පැහැදිලි තීරණයක් ගැනීමට නියමිත බවයි.

මත්පැන්, දිළිඳුකම සහ අඩු ආදායම්ලාභී කණ්ඩායම් අතර සම්බන්ධතාවය කලක පටන් අධ්‍යයනය කෙරෙන්නකි.අධික මත්පැන් භාවිතයේ සෞඛ්‍යමය ඵලවිපාක ඇති වන විට එය දුප්පත්කම  හා සම්බන්ධ කිරීම ඉතා සංකීර්ණය. මිනිසුන් දිළින්දන් වී තිබෙන්නේ ඔවුන් විසින් මත්පැන් සඳහා අධික මුදලක් වියදම් කිරීම හේතුවෙන් ද? එසේත් නැතහොත් මිනිසුන් මත්පැන් වැඩියෙන් පානය කරනුයේ අධික වෙහෙස මඟ හරවා ගැනීම පිණිස ද?

මෙම මාතෘකාව පිළිබඳ වාර්තා කරන විට ජනමාධ්‍යවේදීන් වඩාත් සැලකිලිමත් විය යුතුය. මෙම මාතෘකාව තුළ සමාජ ආර්ථික, මහජන සෞඛ්‍යය සහ සදාචාරාත්මක මානයන් තිබේ. සැබෑ ලෙසින්ම ජනමාධ්‍යවේදීන් ස්වකීය සදාචාරාත්මක මතවාදයන් මත්පැන්වලට පක්ෂ හෝ විපක්ෂව (මතයක් ඉදිරිපත් කිරීම සඳහා වන ලිපියක හැරුණු විට) ඉදිරිපත් නොකළ යුතුය. ඒ වෙනුවට ඔවුන් කරුණුවලට, සංඛ්‍යා දත්ත සහ විද්වත් මතවලට සීමා විය යුතුය. මෙම ගැටලුවේ විවිධ පැතිකඩයන් පිළිබඳව සමාජ විද්‍යාඥයින් සහ වෛද්‍ය විද්‍යාඥයින් සැලකිය යුතු ප්‍රමාණයේ පර්යේෂණ සංඛ්‍යාවක් සිදු කොට තිබේ.

2010 වර්ෂයේ පර්යේෂණ පත්‍රිකාවක සඳහන් වී තිබුණු ආකාරයට “ඉහළ ආදායම් ලබන්නන් මත්පැන් සහ දුම්වැටි වෙනුවෙන් වියදම් කරන මුදලට වඩා අඩු මුදලක් දුප්පතුන් විසින් වැය කරන  නමුත් එම වියදම ඔවුන්ගේ ආදායමෙන් තරමක් විශාල කොටසක් වේ. එබැවින් ඔවුන්ගේ මූලික අවශ්‍යතා සපුරා ගැනීමේ දී ගැටලු ඇති වෙයි. අඩු ආදායම් ලබන රටවල ආර්ථික ප්‍රතිඵලයන්ට හානි වීම ආරම්භ වන්නේ මත්පැන් හා මත්ද්‍රව්‍ය භාවිතය අඩු මට්ටමක පවතින විට වන අතර එය ජනගහනයේ සැලකිය යුතු කොටසකට බලපායි. එවැනි තත්ත්වයක් තුළ අවදානම් මට්ටම් පැහැදිලි කිරීම සහ ආරක්ෂක සීමා සඳහා වන මාර්ගෝපදේශනයන් සිදු කිරීමෙහි විශාල අර්ථයක් නැත.” (Reference found at: goo.gl/Gt4p5o)

2016 ජුනි අග භාගයේ පර්යේෂකයෙකු වන ක්‍රිෂාන් සිරිවර්ධන විසින් ෆේස්බුක් සමාජ ජාලය තුළ කතිකාවක් ආරම්භ කරමින් මෙම මාතෘකාව පිළිබඳ සාකච්ඡා කළ අතර පසුව ඔහු විසින් එය රාවය පුවත්පතට ලිපියක් ලෙස ඉදිරිපත් කර තිබුණි. එහි දී ඉදිරිපත් වූ කරුණු දෙකක් වනුයේ, ගැටලුව වනුයේ බීමත්කමම නොවන නමුත් ඒ සඳහා වැඩියෙන් වියදම් කිරීම බවයි. තවද මෙම විචල්‍ය දෙක එකිනෙකට සම්බන්ධ වන විට එය සරල රේඛිය (හේතුව සහ ප්‍රතිඵල වර්ගයේ) සම්බන්ධයක් නොවේ. ප්‍රමුඛ පෙළේ සමාජ විද්‍යාඥයෙකු වන ආචාර්ය කාලිංග ටියුඩර් සිල්වා මහතා විසින් සිදු කළ ශ්‍රී ලංකාවේ මධ්‍යම පළාතේ දුප්පත් වතු කම්කරුවන් පිළිබඳව වන පර්යේෂණයක් උපුටා දක්වමින් ඔහු පෙන්වා දී තිබුණේ ඔවුන් තම සොච්චම් ආදායමෙන් වැඩි ප්‍රතිශතයක් මත්පැන්, මත්ද්‍රව්‍ය සහ බුලත් සඳහා කෙසේ වැය කරන්නේද යන්නයි. මත්පැත් තුළින් තාවකාලික සහනයක් සෙවීම සඳහා වන දුප්පත් ජනතාවගේ මනෝභාවයන් සැහැල්ලුවෙන් බැහැර කළ හැක්කක් නොවේ. එමෙන්ම ආචාර්ය සිල්වා මහතාට අනුව ඒ සම්බන්ධයෙන් වැඩිදුරටත් පර්යේෂණ සිදු කළ යුතුය.

නීතිගත සහ නීතිවිරෝධී මත්පැන්, සෞඛ්‍ය සහ සමාජයීය බලපෑම,  දිළිඳු මත් ලෝලීන් කිහිප දෙනෙකුගේ අදහස් යනාදිය විමර්ශනය කර බැලිය හැකි නම් දිළිඳුකම සහ මත්පැන් පිළිබඳව සමබර ජනමාධ්‍යවේදීය විමර්ශනයක් සිදු කළ හැකි වනු ඇත.

# 7. දිළිඳුබව වාර්තා කිරීම : අභියෝගවල සහ උපක්‍රම

දිළිඳුකම යනු සංකීර්ණ මාතෘකාවක් බවට වටහා ගෙන පැහැදිලිව හා ගැඹුරින් අනෙකා පිලිබඳ අවබෝධයකින් යුතුව වාර්තා කිරීමේදී ජනමාධ්‍යවේදියෙකුට අභියෝග රැසකට මුහුණ දීමට සිදුවේ.

ප්‍රධානතම අභ්‍යන්තර අභියෝගය වනුයේ විවිධ කතුවරුන්ගේ උදාසීනත්වය නොහොත් නොසැලකිල්ලයි. දෙවෙනි සහ තුන්වෙනි කොටස්වල විස්තර වූ ආකාරයට ඔවුන් දුප්පත්කම සලකනුයේ අවසානයක් නොමැති දුක්ඛිත මාතෘකාවක් ලෙසටයි. මෙහි දී කතුවරුන් අභිප්‍රේරණය කිරීම පිණිස නව්‍ය එමෙන්ම සිත් ගන්නා සුලූ තේමාවන් ඉදිරිපත් කිරීම ජනමාධ්‍යවේදීන්ට පැවරේ. අලුතෙන් නිකුත් වූ නිල සංඛ්‍යාලේඛන, ශාස්ත්‍රීය පර්යේෂණ හෝ පුණ්‍ය ආයතනයක් විසින් සිදු කළ බිම් මට්ටමේ ක්‍රියාකාරකමක් කිසියම් කතා පුවතක් සඳහා පදනම් විය හැකිය. එසේත් නැතිනම් නවෝත්පාදන, දැඩි පරිශ්‍රමය සහ අධිෂ්ඨානයෙන් කටයුතු කර දිළිඳුකම මැඩ ජයගත් දිරිය ගැහැණියක හෝ පිරිමියෙකු පිළිබඳ ප්‍රබල කතාවක් විය හැකිය.

අභ්‍යන්තර බාධාවන් ජයගත් පසුව දරිද්‍රතාවය සම්බන්ධ ඕනෑම ගැටලූවක් වාර්තා කරන ජනමාධ්‍යවේදියෙකු තවත් අභියෝග රැසක් පිළිබඳව අවබෝධ කර ගත යුතුය. එවැනි අභියෝග කිහිපයක් සහ ඒවාට මුහුණ දෙන ආකාරය පිළිබඳ උපාය මාර්ග ද පහතින් යෝජනා කර ඇත.

- **නිල දත්ත වලින් ප්‍රවේශම් වන්න** - රජයේ දිළිඳුකම පිලිබඳ නිල තක්සේරු කිරීම් සහ ප්‍රතිපත්ති, එම ක්ෂේත්‍රයේ සියලූම පැති ආවරණය කරනු නොලබයි. දිළිඳුකම ශීඝ්‍රයෙන් අඩු වී ඇති බව පෙන්වීමට දේශපාලනඥයන් ඉතා නොඉවසිලිමත්ය. සමහර අවස්ථාවල දේශපාලන බලපෑම් මත රජයේ සංඛ්‍යාලේඛන නිලධාරීහු සංඛ්‍යා ලේඛනයන්හි අර්ථ නිරූපණ වෙනස් කරති. එබැවින් ජනමාධ්‍යවේදීන් ශාස්ත්‍රීය සහ ලාභ නොලබන ක්ෂේත්‍රයන් ආදියෙහි වශයෙන් බහුවිධ මූලාශ්‍ර (තනි මූලාශ්‍රයකින් ලියවෙන ලේඛන කිසි විටෙක වටිනා කතා ගොඩ නගනු නොලබයි) සොයා යා යුතුය.
- **ශාස්ත්‍රීය සහ පරිත්‍යාග පිළිබඳ දත්ත ප්‍රශ්න කරන්න** - හොඳ ජනමාධ්‍යවේදීන් සියල්ල ප්‍රශ්න කළ යුතුය. පරිත්‍යාග සඳහා ඉතාමත් ලැදි ලෙස පෙනෙන පුද්ගලයින්ගෙන් හෝ ඉතාමත් විශ්වසනීය ශාස්ත්‍රඥයන්ගෙන් ලැබෙන තොරතුරු පවා ප්‍රශ්න කළ යුතුය. බිම් මට්ටමේ ක්‍ෂුද්‍ර තත්ත්වයන් පිළිබඳව බොහෝ පුණ්‍යායතන සහ රාජ්‍ය නොවන සංවිධාන ඉතා හොඳින් දන්නා බව පෙනෙන්නට තිබුණ ද පුළුල් (ජාතික මට්ටම) තත්ත්වයන් පිළිබඳ අවබෝධය ප්‍රමාණවත් නොවන්නට පුළුවන. සමහරුන් තම දැනුම පවතින ප්‍රමාණයට වඩා වැඩියෙන් දක්වන අවස්ථා ද ඇත. එලෙස සමහර ශාස්ත්‍රීය පර්යේෂණ ඉතා කුඩා ප්‍රමාණයේ නියැදියකින් හෝ ක්‍රමවේදීය සීමාකම් නිසා අසම්පූර්ණ අධ්‍යයන බවට පත් වන අවස්ථා ද ඇත.

- **මූලාශ්‍ර හැසිරවීම පිළිබඳ සොයා බලන්න** - ජනමාධ්‍යවේදීන්ට මූලාශ්‍ර අවශ්‍ය වේ. එසේම රහස්‍යභාවය පිළිබඳ ගැටලු පැන නැගෙන විට තම මූලාශ්‍ර ආරක්ෂා කිරීමට ද ඔවුහු බැඳී සිටිති. එසේම, ජනමාධ්‍යවේදීන් අවදියෙන් සිටිය යුතු වන අතර එවිට මූලාශ්‍රයන් මෙහෙයවීම කළ නොහැකිය. සමහර රජයේ නිලධාරීන්, පර්යේෂකයින් හෝ පුණ්‍ය කටයුතුවල නිරත වී සිටින්නන්ට තමන්ගේ න්‍යාය පත්‍ර සහ අරමුණු පැවතිය හැකි අතර ඔවුන් විසින් තෝරා ගත් තොරතුරු හෝ අර්ථ නිරූපණ සැපයිය හැකිය. විමසිලිමත් ජනමාධ්‍යවේදීන් ඔහුගේම විශ්වසනීය හෝ මිතුරු මූලාශ්‍ර ඇතුළු ව සෑම දෙයක්ම ප්‍රශ්න කරයි.

- **මිනිසුන් යනු ඉලක්කම් නොවන බව මතක තබා ගන්න** - විවිධ තත්ත්වයන් පිළිබඳව අවබෝධයක් ලබා ගැනීමට සංඛ්‍යාලේඛන උදව් වන නමුත් කිසියම් ගැටලුවක් පිළිබඳ අපගේ ගවේෂණය ඉලක්කම්වලට පමණක් සීමා කර නොගත යුතුය. සමාජීය තත්වය සහ දුප්පත්කමට අදාළ සෑම සංඛ්‍යාලේඛනයක් පිටුපසම සිටින්නේ ගෞරවාන්විත ජීවිතයක් පවත්වා ගෙන යාම සඳහා පොර බදින සැබෑ ගැහැණුන් සහ පිරිමින්ය. සංඛ්‍යා ඇසුරින් අවබෝධය ලබා මානව උනන්දුවක් ඇති දෑ කෙරෙහි අවධානය යොමු කරන්න. නිශ්චිත මිනිසුන් හෝ පවුල් කරා ගොස් ඔවුන් සමඟ සාකච්ඡා කර ප්‍රවණතාවයන් පිළිබඳ අවබෝධයක් ලබා ගන්න.

- **ඒකාකාරී දේ කිරීමෙන් වැළකෙන්න** - මෙය සෑම කෙනෙක්ම සඳහා හොඳ අවවාදයකි. නමුත් විශේෂයෙන් ජනමාධ්‍යවේදීන්ට අදාළ වේ. දුප්පතුන් යනු කම්මැලි, විශ්වාස කළ නොහැකි සහ තම වාසියට කටයුතු කරන අය වශයෙන් සමාජයේ විවිධ පූර්ව විනිශ්චයන් පවතී. මෙවැනි මානව චරිත ලක්ෂණ දුප්පතුන් අතර පමණක් නොව ඕනෑම සමාජ ආර්ථික මට්ටමක මිනිසුන් තුළ පවතී. එබැවින් ජනමාධ්‍යවේදීන් විසින් දුප්පත් ජනතාව පිළිබඳ කතා තේමාවන් වාර්තා කිරීමේ දී විවෘත හා අපක්ෂපාතී මනසකින් ඒ සඳහා ප්‍රවේශ වීමට කල්පනාකාරී විය යුතුය. පසුබිමින් සංඛ්‍යාලේඛන දත්ත සපයමින් පුද්ගලයින්ට, ප්‍රජාවන්ට සහ ස්ථානයන්ට අනන්‍ය වූ තොරතුරු තුළින් කතාව ගලායාමට සලස්වන්න. සදාචාරාත්මක විනිශ්චයන් බැහැර කරන්න.

- **ස්ත්‍රී පුරුෂ සමාජභාවී දෘෂ්ටිකෝණයෙන් සලකා බලන්න** - දිළිඳුකම බොහෝවිට සමාජයන්හි පවතින අසමාන බල සබඳතාවන්හි ප්‍රතිඵලයකි. විවිධ සමාජ සහ දේශපාලන සාධකවලින් වඩාත් දූෂ්‍ය වූ දුප්පත්කමින් අසාධාරණ ලෙස පීඩා විඳිනුයේ කාන්තාවන්ය. මාධ්‍ය තුළින් දරිද්‍රතාවය සහ සංවර්ධන ගැටලු වාර්තා කිරීමේ දී ස්ත්‍රී පුරුෂ වෙනස්කම් පිළිබඳව ජනමාධ්‍යවේදීන්ට අවබෝධයක් පැවතිය යුතු අතර ඒ පිළිබඳ සංවේදී විය යුතුය. ස්ත්‍රී පුරුෂ විෂමතා කල්පනාකාරී ලෙස විශ්ලේෂණය කළ යුතුය. පහත සඳහන් වගුව බලන්න.

- **සමාජමය සහ සංස්කෘතිකමය සාධක සලකා බලන්න** - මෙම මාර්ගෝපදේශනයෙහි සඳහන් කළ පරිදි දිළිඳුබව යනු මුදල් හිඟකමට වඩා වැඩි යමකි. සමාජමය සහ සංස්කෘතිකමය සාධක ද මිනිසුන් දුප්පත්කමට බැඳ තබා ගැනීම පිණිස හේතු වේ. එවැනි සංස්කෘතික චර්යාවන්, කුලය වැනි ප්‍රබල සමාජ ධූරාවලීන් හි හෝ උසස් අධ්‍යාපනය, පුහුණුවීම් හෝ රැකියා කිරීමට කාන්තාවන්ට ඉඩ නොදෙන සම්ප්‍රදායන්හි මුල් බැසගෙන තිබිය හැකිය.

අප එයට කැමති වුව ද අකමැති වුව ද මෙවැනි විශ්වාසයන් සහ පුරුදු දැඩි ලෙස සමාජයන්හි මුල් බැස ගෙන තිබේ. දිළිඳුකමේ සහ ඌන සංවර්ධනයේ නිශ්චිත තත්ත්වයන්ට දායකවන කරුණු ලෙස ඒවා හඳුනා ගත යුතුය.

- **වෙනස් වන දෑ -** ශ්‍රී ලංකාව සංක්‍රාන්තික අවධියක සිටින පශ්චාත් යුද සමාජයකි. බොහෝ දෑ වෙනස් වෙමින් පවතින අතර සමහර විටදී ඉතා ශීඝ්‍රයෙන් වෙනස් වෙමින් පවතී. ජනමාධ්‍යවේදීන් විසින් නවතම තත්ත්වයන් වාර්තා කරනු ඇතැයි ද විශ්ලේෂණය කරනු ඇතැයි ද අපේක්ෂා කෙරේ. මේ සඳහා ඔවුන් ඉතාමත් මෑත කාලීන දත්තයන් සොයා ගත යුතු අතර ඉතා  දැනුමෙන් සන්නද්ධ දැනුමැති විද්වතුන් කරා යා යුතුය. වසර පහකට වඩා පැරණි ඕනෑම දත්තයක් බැහැර කළ යුතුය. (වසර 10කට වරක් සිදු කරන ජන සංගණන දත්ත හැරුණු විට). පැරණි ක්ෂේත්‍ර චාරිකා හෝ පැරණි සම්මුඛ සාකච්ඡා ආදියෙහි පිටපත්  භාවිතා කිරීමේ දී සැලකිල්ලෙන් සිදු කළ යුතුය. මන් ද යත් බිම් මට්ටමේ යථාර්ථය වෙනස් විය හැකි අතර නිතරම වෙමින් පවතී.

## ස්ත්‍රී පුරුෂ සමාජභාවය සහ දිළිඳුකම අවම කිරීම

ප්‍රාථමික පවුල් ආරක්ෂකයා නැතහොත් භාරකරුවා , ආහාර නිෂ්පාදකයා, බිම් සකසන්නා, ධාන්‍ය අඹරන්නා, මෙන්ම ජලය ගෙන ගොස් ආහාර පිසීමද කළ යුතු වන්නේ ලෝකයේ බහුතරයක්  දුප්පත් පිරිස අතර සිටින කාන්තාවන්ය.

පිරිමියා සහ ගැහැණිය අතර සමානාත්මතාවය සමාජ සාධාරණතාවයට වඩා වැඩි යමකි. එය මූලික මානව අයිතිවාසිකමකි. නමුත් ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවයේ දී  කාන්තාවන්ට ද අධ්‍යාපනයට සමාන ප්‍රවේශයක් ඇති විට සහ ව්‍යාපාරික සහ ආර්ථික තීරණ ගැනීම සඳහා සම්පූර්ණයෙන්ම සහභාගීත්වය ලැබෙන විට ඔවුන් දුප්පත්කමට එරෙහිව නැඟී එන ප්‍රධාන ගමක ධාවක බලය බවට පත්වේ. සමාන අයිතිවාසිකම් හිමි කාන්තාවන් හොඳ අධ්‍යාපනයක් ලබනු ඇත. ඔවුන්  සෞඛ්‍ය සම්පන්නභාවයකින් යුක්ත වන අතර ඉඩම්, රැකියා සහ මූල්‍යමය සම්පත් වලට හොඳ ප්‍රවේශයක් පවතී. එහි ප්‍රතිඵලයක් ලෙස ඔවුන්ගේ ආදායම් ඉපයීමේ ශක්තිය ඉහළ යන අතර කුටුම්භ ආදායම ද ඉහළ යයි. කුටුම්භය තුළ කාන්තාවගේ තීරණ ගැනීමේ හැකියාව ඉහළ නැංවීමට කටයුතු කිරීම තුළින් දරුවන්ගේ සුභ සිද්ධිය සහ අනාගත පරම්පරාවන්හි දරිද්‍රතාවය අවම කිරීම සඳහා ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය වඩාත් හොඳින් යොදා ගත හැකිය.

සහශ්‍ර සංවර්ධන ඉලක්ක ඉටු කර ගැනීමේ දී ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය සහ කාන්තාවන් සවිබල ගැන්වීම කේන්ද්‍රීය සාධක වේ. ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ යම් යම් ධනාත්මක ප්‍රවණතාවයන් පැවතිය ද සැලකිල්ල යොමු විය යුතු තවත් ක්ෂේත්‍ර ගණනාවක් පවතී. පාසල් නොයන ළමුන්ගෙන් බහුතරය ගැහැණු ළමයි වෙති. සංවර්ධනය වෙමින් පවතින රටවල කාන්තාවන් තුනෙන් දෙකක්ම අවිධිමත් ක්ෂේත්‍රයේ රැකියාවල නිරතව සිටින අතර එසේත් නැතහොත් වැටුප් නොලබන සේවකයින් ලෙස නිවසේ වැඩකටයුතුවල නිරත වෙති. පාර්ලිමේන්තුවේ ඉහළ කාන්තා සහභාගීත්වයක් තිබිය දී වුව ලොව පුරා නීති සම්පාදන ආයතනයන්හි කාන්තා සහභාගීත්වය හතරට එකක් වැනි අවම මට්ටමක පවතී.

උපුටා ගනු ලැබුවේ : එක්සත් ජාතීන්ගේ සංවර්ධන අරමුදලේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය සහ
දිළිඳුකම අවම කිරීමේ වැඩසටහනෙනි
http://www.undp.org/content/undp/en/home/ourwork/povertyreduction/focus_areas/focus_gender_and_poverty.html

## සිද්ධි අධ්‍යයනය 2 : ශ්‍රී ලංකාව කෙතරම් නාගරීකරණය වී ඇත් ද ?

කිසියම් රටක් නාගරීකරණය වී ඇති මට්ටම එරට ආර්ථික සංවර්ධනයේ සහ එහි ජනතාවගේ ජීවන මට්ටම පිළිබඳ නිර්ණායකයකි. එසේ නම් ශ්‍රී ලංකාව කෙතරම් නාගරීකරණය වී තිබේ ද? අප ප්‍රධාන වශයෙන් ග්‍රාමීය යැයි යන්න බොහෝ දෙනෙකු විසින් පුනරුච්චාරණය කරනු ලබන මතය වෙයි. නමුත් තව දුරටත් මෙය වලංගු වේ ද?

2012 ජන හා නිවාස සංගනනයට අනුව ලාංකිකයන් 18.2%ක් නාගරික ලෙස වර්ගීකරණය කොට තිබේ. කෙසේ නමුත් පටු නිර්වචනයක් භාවිතා කර තිබීම නිසා මෙම ප්‍රතිශතය නොමඟ යවන සුලු එකක් බවට පත්ව ඇත. දැනට මහ නගර සභා සහ නගර සභා බල ප්‍රදේශවල ජීවත්වන පුද්ගලයින් පමණක් නාගරික ජනගහණය ලෙස සැලකේ. සැබෑව නම් සමහර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශ ද නාගරීකරණය වූ ඒවා ලෙස පැවතීමයි.

2015 වර්ෂයේ නොවැම්බර් මාසයේ කොළඹ පැවති සමුළුවක් අමතමින් මෙගා පොලිස් මහ නගර සහ බස්නාහිර සංවර්ධන අමාත්‍ය චම්පික රණවක මහතා සඳහන් කළේ ශ්‍රී ලංකාවේ නාගරික ජනගහනය 48%ක් තරම් ඉහළ මට්ටමක පැවතිය හැකි බවයි. එය දැනට පවතින ප්‍රතිශතයට වඩා 2.5 ගුණයකින් ඉහළ අගයකි.

උදාහරණ ලෙස ඔහු සඳහන් කළේ හෝමාගම, බේරුවල සහ වැලිගම වැනි නාගරික ගුණාංගයන් රැසක් දැකිය හැකි ප්‍රාදේශීය සභා පරිපාලනමය වශයෙන් ග්‍රාමීය ලෙස වර්ගීකරණය ඇති බවයි. ඔහුගේ ප්‍රමුඛ අවධානය යොමු වූයේ එවැනි දුර්මතයන් හේතුවෙන් යටිතල පහසුකම් සහ නාගරික සංවර්ධනයන් පිළිබඳව රටේ ප්‍රතිපත්ති තීරණ නිවැරදි ලෙසි නියෝජනය නොවන බවයි.

ලෝක බැංකුවේ නාගරික සංවර්ධන උපාය මාර්ග සඳහා වූ ගෝලීය ප්‍රධානී, සුමිලා ගුල්යානි එම අවස්ථාවට එක් වෙමින් ශ්‍රී ලංකාවේ ජනගහනයෙන් අඩකට ආසන්න සංඛ්‍යාවක් දැනටමත් නාගරික බවට පත් ව ඇතැයි පිළිගත්තාය. ඇයට අනුව ලෝක බැංකුවේ ඇස්තමේන්තු දළ වශයෙන් ඒ හා සමානය. "ශ්‍රී ලංකාවේ නාගරික ජනගහනය පිළිබඳ නිල සංඛ්‍යාලේඛන වලට අනුව එහි ප්‍රතිශතය 14 %සිට 18% දක්වා වෙයි. නමුත් ඔබ ජනාකීර්ණතාව දෙස බැලුවහොත් එය සැබවින්ම 47%කට ආසන්න බව පෙනෙනු ඇත."

තව දුරටත් අදහස් දක්වමින් ඇය සඳහන් කළේ " සියලුම දකුණු ආසියානු රටවල් තම නාගරීකරණ මට්ටම සාපේක්ෂව අඩුවෙන් දක්වන බවයි. ඉන්දියාවේ ද මේ තත්ත්වයම දැකිය හැකිය. මේ සඳහා සාම්ප්‍රදායිකවම හේතු වී ඇත්තේ ග්‍රාමීය ප්‍රදේශවලට වැඩිපුර ජාතික සහනාධාර වැඩසටහන් ගලා ඒමයි. එසේම කිසිඳු පරිපාලනයක් තමන් නාගරික යැයි අමතනු ලැබීමට කැමති නැත.

සමස්තයක් ලෙස දකුණු ආසියාව පිළිබඳ කතා කරන්නේ නම් එහි මිශ්‍ර ජනගහනයෙන් 30%ක් ම මේ වන විට ජීවත් වන්නේ නගරබදවය. එළඹෙන දශකයන්හි මෙම ප්‍රමාණයෙහි අති විශාල ඉහළ යාමක් අපේක්ෂා කෙරේ. ශ්‍රී ලංකාවට මෙම ප්‍රවණතාවයට එරෙහිව යා නොහැකිය.

මෙම තත්ත්වය නොතකා පැරණි මිථ්‍යා අදහස වසර ගණනාවක් තිස්සේ විශ්වාස සමාජගතව ඇත . ගුල්යානි විසින් මතු කර දක්වන ගැටලුව වන්නේ ශක්‍යතා නොගැළපීමයි. "නාගරික ප්‍රදේශයක් පාලනය කරනුයේ ප්‍රාදේශීය සභාවක් විසින් නම් එලදායී නාගරික සංවර්ධනයක් සඳහා උචිත ආකාරයේ සැලසුම් සහ නාගරික කළමනාකරණයක් ඒ තුළ දැකීමට ඔබට නොහැකි වනු ඇත."

මේ අතර "Leveraging Urbanization in South Asia( Managing Spatial Transformation for Prosperity and Livability" නම් ශීර්ෂයෙන් යුත් ලෝක බැංකු වාර්තාවකට අනුව (සැප්තැම්බර් 2015) ශ්‍රී ලංකාවේ ජනගහනයෙන් නාගරික ප්‍රදේශවල ජීවත්වේ යැයි නිල වශයෙන් වර්ගීකරණය කර ඇති ප්‍රමාණය 2000 සහ 2010 කාලය ඇතුළ කරමක් දුරට පහත වැටී ඇත.

"කෙසේ නමුත් මෙම නිල සංඛ්‍යාලේඛන වලින් සැලකිය යුතු ලෙස 'සැඟවුණු' නාගරීකරණය මග හැරී ඇතැයි වාර්තාවේ සඳහන් වේ.

"නාගරිකත්වයට ආවේණික ප්‍රබල ගති ලක්ෂණ පවතින නමුත් ශ්‍රී ලංකාවේ ජනගහනයෙන් තුනෙන් එකක් නිල වශයෙන් නාගරික යැයි ප්‍රකාශයට පත් කර නැති ප්‍රදේශවල ජීවත් වෙතැයි වාර්තාවෙන් යෝජනා කරයි." රාත්‍රී කාලයේ දැල්වෙන විදුලි බුබුළු සහ අනෙකුත් දුරස්ථ සංවේදී භූමි නිරීක්ෂණ දත්ත වැනි සම්මත මූලාශ්‍රයන්ගෙන් බැහැර වූ දත්තයන් භාවිතා කිරීම තුළින් අපේ කලාපයේ දත්තයන්හි පවතින විෂමතා මැඩ පැවැත්වීමට ඉහත කී වාර්තාවෙන් උත්සහ දරනු ලබයි.

සම්පූර්ණ ලිපිය : http://www.dailymirror.lk/94975/let-s-get-real-about-sri-lanka-s-urbanization

## සිද්ධි අධ්‍යයනය 3 : වැසිකිළි ද දුරකථන ද ? මෙන්න වැරදි ප්‍රශ්නයක් !

ලොව වටා බිලියන 2.5කට ආසන්න ජනතාවකට පිරිසිදු, පෞද්ගලික වැසිකිළි පහසුකම් නැත. ලෝක වැසිකිළි දිනය (නොවැම්බර් 15) හරහා මෙම වටිනා වැදගත් කර්තව්‍ය වෙනුවෙන් සටන් කරනු ලබන අතර සනීපාරක්ෂාව මූලික මානව අයිතිවාසිකමක් ලෙස විශ්වාස කරනු ලබයි.

නමුත් සමහර අවස්ථාවල සමහර ක්‍රියාකාරීන් හුදෙකලා ගැටලු පිළිබඳ ඉතා උද්යෝගීමත් වෙයි. ඒ තුළ ඇති එක් සිද්ධියක් පමණක් පොදු සිරස්තලය බවට පත්වේ. බොහොමයක් මිනිසුන්ට වැසිකිළි පහසුකම් වලට වඩා ජංගම දුරකථන පහසුකම් ඇත.

නිතරම උපුටා ගැනීමට ලක් වෙන්නේ ඉන්දියාව පිළිබඳ උදාහරණයයි. 2011 ජන සංගණනයට අනුව ඉන්දියානු පවුල් 63.2% කට දුරකථන සබඳතා (බොහෝ විට ජංගම දුරකථන) තිබී ඇති නමුත් පවුල් 53.1%කට වැසිකිළි සඳහා කිසිදු පහසුකමක් තිබී නොමැත. ග්‍රාමීය ප්‍රදේශවල මෙම තත්ත්වය වඩාත් දරුණුය. ග්‍රාමීය ප්‍රදේශවල එම ප්‍රතිශතය 67.3% (මිලියන 600කට ආසන්න ජනතාවක්)කි. බොහෝ දෙනෙකු බල කිරීම මත එළිපහළියේ මලපහ කිරීම සිදු කරයි.

නමුත් මෙය මුළුමනින්ම වැරදි සංසන්දනයක් බව කොළඹ පදනම් කරගත් තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය පිළිබඳ අධ්‍යයනය කරන බුද්ධි මණ්ඩලයක් වන ලර්න් ඒෂියා ප්‍රධානී ආචාර්ය රොහාන් සමරජීව මහතා පවසයි.

මීට පරම්පරාවකට පමණ පෙර දකුණු ආසියාවේ වරප්‍රසාද විඳි පවුල් සතුව මුළු පවුල විසින් ම භාවිතා කරන එක් රැහැන් සහිත දුරකථනයක් තිබුණි. වර්තමානයේ මේ තත්ත්වය බොහෝ සෙයින් වෙනස් වී තිබේ. දුරකථනයක් හිමි කර ගැනීමේ සහ භාවිතා කිරීම සඳහා වන පිරිවැය අඩු වී තිබේ. මේ හේතුවෙන් දිළිඳු ජනතාවට පවා දුරකථනයක් භාවිතා කිරීමට සහ මිල දී ගැනීමට හැකියාව ලැබී තිබේ. බොහෝ දෙනෙකු ජංගම දුරකථනය පෞද්ගලික උපකරණයක් ලෙස සලකනු ලබන අතර තවදුරටත් එය හුවමාරු කර ගන්නා දෙයක් නොවේ.

ලර්න් ඒෂියා විසින් 2006 සිට සිදු කරන බහු ජාතික, මහා පරිමාණ නියැදි සමීක්ෂණයට අනුව වර්ධනය වෙමින් පවතින දුරකථන පරිශීලකයින් පිරිස සතුව ජංගම දුරකථන සිම්පත් කිහිපයක් තිබෙන ආකාරය පෙනී යයි. විවිධ දුරකථන ගාස්තු සහ පැකේජ වාසි භුක්ති විඳීම සඳහා ඔවුහු දුරකථන ජාල කිහිපයක්ම භාවිතා කරති.

සමරජීව මහතා විස්තර කරන ආකාරයට ජංගම දුරකථන යනු පෞද්ගලික උපාංගයකි ; වැසිකිළි යනු පොදුවේ ගතහොත් කුටුම්භ පහසුකමකි. සාමාන්‍යයෙන් වැසිකිළි සංඛ්‍යාව ගෘහයක වාසය කරන පුද්ගලයින් සංඛ්‍යාවට වඩා අඩුය. ජනතාව සතු දුරකථන සිම්පත් සංඛ්‍යාව සමඟ වැසිකිළි සංඛ්‍යාව සෘජුව සංසන්දනය කළ හැකි අර්ථවත් ක්‍රමයක් නැත.

කිසියම් කෙනෙකුට සත්‍ය වශයෙන් ම තර්කානුකූල ලෙස ජංගම දුරකථන හා වැසිකිළි සංසන්දනයක් අවශ්‍ය නම් ඉල්ලුම පැත්තෙන් ඇති දත්ත සලකා බලන ලෙස රොහාන් සමරජීව මහතා යෝජනා කරයි. ඔහු එවැන්නක් වරෙක ලංකාවේ දී සිදු කළේය. ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් දිවයින පුරා කුටුම්භ 22,500ක නියැදියක් ආවරණය වන පරිදි සිදු කළ 2009/10 කුටුම්භ ආදායම් හා වියදම් සමීක්ෂණය සඳහා රැස්කළ දත්ත භාවිතා කරමින් ඔහු එය සිදු කළේය. දුරකථන සහිත කුටුම්භ සංඛ්‍යාව සමඟ නිවැසියන් සඳහාම පමණක් අයත් වැසිකිළි පහසුකම් සහිත කුටුම්භ සංඛ්‍යාව සමඟ යම් ප්‍රමාණයකින් හෝ ආසන්න මට්ටමට පැමිණියේ පොහොසත්ම බස්නාහිර පළාතේ පමණක් බව ඔහු විසින් අනාවරණය කරගනු ලැබීය.


සනීපාරක්ෂාව යනු සරල ලෙස මහජන, පෞද්ගලික හෝ පුණ්‍යාධාර මුදල් ආයෝජනය කිරීමට අදාළ කරුණක් නොවේ. ජල සැපයුම, ඉඩම් භුක්තිය සහ නිවාස හිමිකම මෙහිදී සැලකිල්ලට ගත යුතුය. දකුණු ආසියාවේ බොහෝ කොටස්වල යටිතල පහසුකම් සංවර්ධනය නාගරික දියුණුවට වඩා පසුපසින් සිටියි.

සමහර ක්‍රියාකාරීන් තර්ක කරනු ලබන ආකාරයට ජනතාව කැමැත්තෙන් ම වැසිකිළි වෙනුවට ජංගම දුරකථන මිල දී ගන්නවා නොවේ. මිලියන සිය ගණනකට වැසිකිළි පහසුකම් නැත්තේ ඇයිද යන්නට ආර්ථික සහ යටිතල පහසුකම්වලට අදාළ ගැටලු තිබේ. මෙහි දී සංස්කෘතිය සහ අධ්‍යාපනයේ භූමිකාව එතරම් සුවිශේෂී නැත.

දුප්පත් ජනතාවගේ සම්පූර්ණ වී නැති සනීපාරක්ෂක පහසුකම් සැබවින්ම විශාල ගැටලුවකි. ඒ සඳහා දේශපාලන අවධානය, ප්‍රායෝගික තාක්ෂණය සහ අර්ථවත් ආයෝජන පැවතිය යුතුය.නමුත් අතාර්කික සංසන්දනයන් හරහා ජංගම දුරකථන භාවිතය විවේචනය කිරීම තුළින් මෙම තත්ත්වය හොඳ අතට හැරෙන්නේ නැත.

සකස් කරනු ලැබුයේ https://collidecolumn.wordpress.com/2012/11/25/when-worlds-collide-43-toilets-or-telephones-thats-the-wrong-question/ ඇසුරිනි.

# 8. මං හෙළි පෙහෙළි කළ අයගේ දැනුමින් බිඳක්- පී සයිනාත්



**පී. සයිනාත්**

පැලගුම් සයිනාත් යනු සමාජ සහ ආර්ථික අසමානත්වය, ග්‍රාමීය කටයුතු, දිළිඳුකම සහ ගෝලීයකරණයෙන් පසුව ස්වකීය රට වූ ඉන්දියාවේ ඇති වූ ප්‍රතිවිපාක ආදිය පිළිබඳ නව ඉසව් ආවරණය කළ කීර්තිමත් ඉන්දියානු ජනමාධ්‍යවේදියෙකු සහ ඡායාරූප මාධ්‍යවේදියෙකි. ඔහු විසින් සිදු කළ සියලුම ලේඛන කටයුතු තුළින් දිළිඳුකමේ මානුෂීය පැති සොයා ගියේය. ආර්ථික විද්‍යාඥයෙකු සහ නොබෙල් සම්මානලාභියෙකු වන අමාත්‍ය සෙන් විසින් වරෙක "සාගත සහ කුසගින්න පිළිබඳව ලොව සිටින ශ්‍රේෂ්ඨතම විද්වතුන් අතරින් කෙනෙකු" ලෙස ඔහුව හඳුන්වනු ලැබිණි.


1991 වර්ෂයේ ඉන්දියාව ආර්ථික නිර්බාධකරණය හඳුන්වා දීමෙන් පසු මාධ්‍ය අවධානය 'ප්‍රවෘත්ති' වල සිට 'විනෝදාස්වාදය' දෙසට ගමන් කරන බව ඔහුට දැනුනි. නාගරික ප්‍රභූ පන්තියේ පාරිභෝජනවාදය සහ ජීවන රටාවන් වලට පුවත්පත්වල ප්‍රමුඛතාවයක් ලබා දෙන විට ඉන්දියාවේ දුප්පත්කම පිළිබඳ ප්‍රවෘත්ති පළ කළේ ඉතාමත් කලාතුරකිනි. "ඉන්දියානු පුවත්පත් ඉහළම තලයේ සිටි 5%ක ප්‍රතිශතය පිළිබඳ වාර්තා කරන්නේ නම් මා විසින් පහළම තලයේ සිටින 5% පිළිබඳව වාර්තා කළ යුතු බව මට දැනුණා" යි ඔහු සිහිපත් කරයි.

1993 වර්ෂයේ සයිනාත්ට 'ටයිම්ස් ඔෆ් ඉන්දියා' අධිශිෂ්‍යත්වය හිමිවුණු අතර ඔහු එයද සමඟ ඉන්දියානු ප්‍රාන්තයන්හි පිහිටි දුප්පත්ම දිස්ත්‍රික්ක 10ක් සොයා මගට බැස්සේය. ඉන්දියාව පුරා කිලෝ මීටර් 100,000කට ආසන්න දුරක් ආවරණය කිරීම ඊට ඇතුළත් වී තිබුණි. ඊට ප්‍රවාහන විධි ක්‍රම 16ක් භාවිතා කිරීම ඇතුළත්ව තිබූ අතර වසර දෙකකට අධික කාලයක් කිලෝ මීටර් 5,000ක දුරක් පයින්ම ඇවිදීමට ද ඔහුට සිදු විය. මෙම කාලය තුළ සයිනාත් විසින් රචනා කළ ලිපි පදනම් කර ගනිමින් 'ටයිම්ස් ඔෆ් ඉන්දියා' පුවත්පත ක්ෂේත්‍ර පාදක ලිපි 84ක් පළ කළේය. ඉන් බොහොමයක් සයිනාත් විසින් රචිත *Everybody Loves A Good Drought* (1996) නම් කෘතියෙහි නැවත පළ වී තිබුණි.

හැඳින්වීමෙහි ඔහු සඳහන් කරන ආකාරයට ඔහුගේ එම චාරිකාව මඟින් ඔහු බලාපොරොත්තු වූයේ ග්‍රාමීය දිළිඳු ජනතාව සමඟ කාලය ගත කිරීමෙන් සහ ඔවුන් සමඟ කතා කිරීමෙන් ඔවුන්ගේ ජීවන තත්ත්වය විමර්ශනය කිරීමයි. නමුත් ඔහු ඊට පෙර නිල සහ ශාස්ත්‍රීය වාර්තා කියා වූ අතර එය බිම් මට්ටමේ යථාර්ථවන් සමඟ සංසන්දනය කළේය.

ඔහු වැඩි වශයෙන් කෘෂිකාර්මික කටයුතු සිදු නොකරන කාලයන්හි ක්ෂේත්‍රයට ගියේය. ඔහු විසින් එහි දී මතු කළ ප්‍රශ්නය වූයේ තම ප්‍රදේශවල කෘෂිකාර්මික කටයුතු සිදු නොකරන වසරේ දින 200-240ක පමණ කාලය තුළ දුප්පත් ජනතාව කුමක් කරන්නේ ද යන්නයි. ඔවුන් ජීවත් වන්නේ කෙසේද? ඔවුන් ජීවත් වීම සඳහා කුමන උපාය මාර්ග අනුගමනය කරන්නේ ද?

ගොවිතැන් නොකරන අවස්ථාවන්හි ඔවුන් විසින් සොයාගනු ලබන විකල්ප ජීවනෝපාය මාර්ග මොනවාද ? යනාදියයි.




මෙහි අදහස වන්නේ එකී තත්ත්වයන් ක්‍රියාවලියක් ලෙසින් හඳුනා ගැනීමයි. ඉතා කලාතුරකින් අවස්ථාවක දුප්පත්කම හුදෙක් සිද්ධීන් ලෙස වාර්තා කරනු ලබයි. යම් විපතක් සිදු වූ විට, මිනිසුන් මිය ගිය විට වැනි අවස්ථා එසේ ආවරණය කරනු ලබයි. එතෙකුදු වුවද දිළිඳුකම යනු හාමත් වීම හෝ සාගතයට ආසන්න තත්ත්වයන්ට වඩා වැඩි යමකි. එය බහුවිධ සාධකයන්ගේ එකතුවකි. කලාපයෙන් කලාපයට, සමාජයෙන් සමාජයට, සංස්කෘතියෙන් සංස්කෘතියට මෙවැනි තත්ත්වයන්ගේ වැදගත්කම විවිධ වේ. නමුත් කේන්ද්‍රය තුළ ඇත්තේ සාධාරණ ලෙස සංගත වූ සාධකයන්ය.

භූමිය, සෞඛ්‍යය, අධ්‍යාපනය, සාක්ෂරතාව, ළදරු මරණ අනුපාතිකය සහ ජීවිත අපේක්ෂාව ඉන් කිහිපයකි. ණය, වත්කම්, වාරි මාර්ග, පානීය ජලය,සනීපාරක්ෂාව සහ රැකියා ද ඇතුළත් විය යුතුය.

"දිනකට අනිවාර්යෙන් ලබා ගත යුතු කැලරි ප්‍රමාණය වන කැලරි 2400 හෝ 2100 ලැබුණද ඔබ ඉතා දුප්පත් විය හැකිය. ඉන්දියාවේ ගැටලු සෝමාලියාවේ හෝ ඉතියෝපියාවේ ඇති ගැටලුවලට වඩා වෙනස්ය. කුසගින්න යනු නැවතත් දිළිඳුකමේ එක් පැත්තක් පමණි. එය ඉන්දියාව තුළ වඩාත් සංකීර්ණය. එය ඉතාමත් පහත මට්ටමේ පවතින, අඩුවෙන් දෘශ්‍යමාන වන සෝමාලියාවේ හෝ ඉතියෝපියාවේ මෙන් රූපවාහිනියෙන් නාට්‍යාකාර ලෙස පෙන්විය හැකි යමක් නොවේ. මේ හේතුව නිසා දිළිඳුකම වාර්තා කිරීමේ ක්‍රියාවලිය වඩාත් අභියෝගාත්මක සහ ඒ නිසාම වඩාත් වැදගත් ද වේ. කුසගින්නෙන් පෙළෙන බොහෝ දෙනෙකුට ලැබෙනුයේ කිසිසේත් ප්‍රමාණවත් පෝෂණයක් නොවේ. ළමයින්ට අවශ්‍ය කරන ප්‍රමාණයට වඩා අඩුවෙන් ආහාර ලැබීම ඉතාමත් සාමාන්‍ය දෙයක් ලෙස පෙනෙන්නට පුලුවන. පෝෂණ ඌණතාවය හේතුවෙන් මානසික සහ කායික වර්ධනය හානි විය හැකි අතර එහි අහිතකර ප්‍රතිවිපාකවලින් ඔවුන් මුළු ජීවිත කාලයම විඳවනු ඇත. කිසියම් පුද්ගලයෙකුට තීරණාත්මක අවස්ථාවන්හි අවම සෞඛ්‍ය පහසුකම් නොලැබීම කුසගින්නේ සිටින්නෙකු හා සමානවම විනාශයක් අත්පත් වනු ඇත." වශයෙන් ඔහු සඳහන් කරයි.

සයිනාත්ගේ ක්ෂේත්‍ර පාදක වාර්තා තුළින් විවිධ මාතෘකා ආවරණය කරනු ලැබිණි. ග්‍රාමීය ඉන්දියාවේ අධ්‍යාපනය සහ සෞඛ්‍යාරක්ෂණය පිළිබඳ යථාර්ථයන් ඔහු මතු කර පෙන්වීය. සුළු පරිමාණ ගැමි ගොවීන් ණය උගුලට හිර වී සිටින්නේ කෙසේද සහ දේශගුණික විෂමතා සහ අස්ථාවර වෙළඳපොළ මිල ගණන් පිළිබඳව ද ඔහු විමර්ශනය කළේය. දුප්පත් ගැමියන් කුල සාධකය සහ තිලබල වාදය නිසා තම ජීවන ප්‍රමිතීන් ඉහළ දමා ගැනීම අවහිර කර ගෙන සිටින්නේ කෙසේදැයි ඔහු සටහන් කළේය. නියගය, ගංවතුර වැනි ස්වභාවික විපත්වල බලපෑම්වලින් පීඩාවට පත් ප්‍රජාවන් එවැනි විනාශයන්ට මුහුණ දෙන්නේ කෙසේදැයි ඔහු අධ්‍යයනය කළේය. ග්‍රාමීය ජනතාවට වනාන්තරවලට ඇතුළු වීමට ඇති හැකියාව සහ කාන්තාවන්ට ආදායමක් ලැබීමට සහ දේපළ හිමිකාරීත්වය ලැබීමට ඇති අයිතිය වැනි පුළුල් ප්‍රශ්න ඔහු නැගීය.

ග්‍රාමීය සංවර්ධනයේ නාමයෙන් මහජන මුදල් මහා පරිමාණයෙන් අපතේ යනු හා කොල්ලකනු සයිනාත් විසින් අනාවරණය කළේය.

ඔහුගේ උදාහරණ රැසක් අතුරින් කිහිපයක්,

- එක් ග්‍රෝතික සාමාජිකයෙක් පමණක් ජීවත් වූ ගෝත්‍රික ගම්මානයකට පිවිසීම සඳහා මාර්ගයක් ඉදි කිරිම.
- රුපියල් මිලියන 20ක් වැය කළ කිරි කර්මාන්තය සංවර්ධනය කිරීමේ ප්‍රමුඛ පෙළේ ව්‍යාපෘතියකින් වසර දෙකකට පසුවත් එකඳු අමතර කිරි ලීටරයක් නිෂ්පාදනය කිරීමට අපොහොසත්ව තිබීම.

ඔහු විසින් ගැටලූ සහ ඒවාට පදනම් වූ හේතු පිළිබඳ පමණක් නොව දුප්පත් ගැමි ජනතාවගේ නම්‍යතාවය, රාජ්‍ය නොවන සංවිධානවල අව්‍යාජ සේවකයින්ගේ කැපවීම, සහ බිම් මට්ටමෙන් සාර්ථක වූ නව්‍ය විසඳුම් පිළිබඳව ද වාර්තා කළේය.

ඇතැම්විට ජනතාවට සේවය කිරීම පිණිස ඔවුන්ටම ආවේණික ක්‍රමයකට සටන් වැදුණු අවංක රජයේ නිලධාරීන් පිළිබඳ විශේෂාංග ලිපි ලිවීය.

දුප්පතුන් යනු ඉන්දියාවේ ප්‍රගතියේ මාවත අවහිර කර කොටසක් ලෙස විශ්වාස කිරීමට සහ වාර්තා කිරීමට නිලධාරීන් විසින් ප්‍රාදේශීය සහ ජාතික මට්ටමේ ජනමාධ්‍යවේදීන්ව නොමඟ යවා තිබූ ආකාරය ඔහු විසින් විවේචනය කළේය.

සයිනාත්ගේ ලේඛනයන්හි කිසියම් බලපෑමක් තිබුණි. එහි පියවරයන් ලෙස තමිල්නාඩුවේ නියං කළමනාකරණ වැඩසටහන නිසි ලෙස සකස් කිරීම, ඔරිස්සා ප්‍රාන්තයේ ආයුර්වේද වෛද්‍ය ක්‍රමය පිළිබඳ ප්‍රතිපත්තියක් සකස් කිරීම සහ මධ්‍ය ප්‍රදේශයේ ගෝත්‍රික ජනතාව සඳහා වූ ප්‍රාදේශීය සංවර්ධන වැඩසටහන සකස් කිරීම වැනි විවිධ පියවරයන් රජය විසින් ගනු ලැබීය. අන්ද්‍රා ප්‍රාන්තයේ කෘෂිකර්මාන්තය නගා සිටුවීම සඳහා ක්‍රමෝපායන් යෝජනා කිරීම පිණිස කෘෂිකර්ම කොමිෂම පිහිටු වීමට ඔහු සක්‍රීය ලෙස දායක විය.

නගරයේ පිහිටි තම කාර්යාලයෙන් එළියට විත් ඉන්දියාවේ හුදෙකලා ප්‍රදේශවල වෙසෙන බහුතරයක් දුප්පත් ජනතාව සමඟ කතා කිරීමට සහ ඔවුන්ට සවන් දීමට සයිනාත් විසින් තරුණ ජනමාධ්‍යවේදීන්ව පොළඹවනු ලැබීය.

*Everybody Loves A Good Drought* කෘතිය 34වන මුද්‍රණයේ පවතින අතර ඉන්දියාවේ සහ විදේශ විශ්වවිද්‍යාල 100කට අධික සංඛ්‍යාවක් එය පරිශීලනය කරයි. අනූ ගණන්වල අගභාගයේ ඉන්දියාවේ එවකට ජ්‍යෙෂ්ඨතම කතුවරයෙකු වූ නිකිල් චක්‍රවර්ති විසින් සයිනාත්ගේ පරිශ්‍රමය "ඉන්දියානු ජාතියේ හෘද සාක්ෂිය" ලෙස හැඳින්වීය.

2007 වර්සයේ දී ආසියාවේ ජනමාධ්‍ය සාහිත්‍යය සහ නිර්මාණාත්මක සන්නිවේදන කලා සඳහා පිරිනැමෙන වඩාත්ම ගෞරවාන්විතම සම්මානය (ආසියාවේ නොබෙල් ත්‍යාගය ලෙස ද හැඳින්වේ) ලෙස සැලකෙන රාමන් මැග්සයිසේ සම්මානයෙන් ඔහු පිදුම් ලැබීය. ගැමි දුප්පත් ජනතාව ඉන්දියානු ජාතිකමය හෘද සාක්ෂිය වෙත ගෙන ඒම සඳහා ජනමාධ්‍යවේදියෙකු ලෙස ඔහු තුළ පැවති ලාලාසාව මුසු කැපවීම වෙනුවෙන් ඔහුට එම සම්මානය පිරි නැමිණි.

**මූලාශ්‍ර** - http://psainath.org/about-p-sainath/about/
https://en.wikipedia.org/wiki/Palagummi_Sainath http://www.thehindu.com/opinion/columns/sainath/

# 9. මං හෙළි පෙහෙළි කළ අයගේ දැනුමින් බිඳක් : කල්පනා ශර්මා



කල්පනා ශර්මා

"ජනමාධ්‍යවේදීන් හොඳ හෝ නරක, වෘත්තීය හෝ වෘත්තීය නොවන අයවලුන් විය හැකිය. 'පාරිසරික' හෝ 'සංවර්ධනාත්මක' වැනි අනෙකුත් ලේබලයන් ජනමාධ්‍යවේදීන්ට ඇලවිය යුතු යන්න මට නොසිතේ."

එලෙස පවසනුයේ දශක ගණනාවක් පුරා සංවර්ධනය සහ සමාජ සාධාරණත්ව ගැටලු පිළිබඳව වාර්තා කරන ඉන්දියාවේ වඩාත්ම අත්දැකීම් සහිත ජනමාධ්‍යවේදිනියක වන කල්පනා ශර්මාය. ඇය 'කියන දේ කරන' ජනමාධ්‍යවේදිනියක ලෙස සෑම තැනකම සිටින ජනමාධ්‍යවේදීන්ට දිදුළන ආදර්ශයක් වූවාය.

ඇය, අප මේ කතා කරන සංවර්ධනය සහ දුප්පත්කම පිළිබඳ වාර්තාකරණයේ අලුත් මංපෙත් විවර කරන්නියක මෙන්ම පුරෝගාමියෙකු ද වූවාය. මගේ අදහසට අනුව ඉන්දියානු සන්දර්භය තුළ සංවර්ධනය ගවේෂණය කිරීම සහ විචාරයට ලක් කිරීම පිළිබඳ ස්වර්ණමය ප්‍රමිතීන් ඇති කළේ ඇය විසිනි.

ඇය ස්වකීය වෘත්තීය ජීවිතය තුළ 'ටයිම්ස් ඔෆ් ඉන්දියා', 'ඉන්දියන් එක්ස්ප්‍රස්' සහ 'හිම්මත්' (1946-1981) ආදී පුවත්පත්වල සේවය කළාය, නමුත්, ප්‍රධාන ධාරාවේ මාධ්‍ය බොහොමයක් විසින් නොසලකා හැර තිබූ අනෙක් ඉන්දියාව පිළිබඳව වාර්තා කරමින් ඇය විශිෂ්ටත්වයට පත් වූයේ 'ද හින්දු' පුවත්පත යටතේ සේවය කරමින් සිටින විටය. ඇය විශ්‍රාම යන විට එහි උප කර්තෘ ලෙස සේවය කළාය.


'අනෙක් ඉන්දියාවේ' පදිංචිකරුවන් වන්නේ දිනකට ඩොලර් 1.25ක් වන ගෝලීය දරිද්‍රතා රේඛාවට පහළින් ජීවත් වන ලෝකයේ සමස්ත දුප්පතුන්ගෙන් තුන්වන තැනට පත් මිලියන 400කට වැඩි ඉන්දියානු ජනතාවයි.

කල්පනාගේ ලිපි තුළ නිරන්තරයෙන් කුතුහලය, සමාජ සාධාරණත්වය පිළිබඳ හැඟීම, ගම් දනව් සිසාරා සැරිසැරීමේ ආශාව සහ ජනතාව පිළිබඳ ව ගැඹුරු ආලය මිශ්‍රව පැවතිණි. ඇය ප්‍රධාන ධාරාවේ මාධ්‍යයන්හි ව්‍යාකූල සහ අවිනිශ්චිත සමයන්හි පවා ගුණාත්මකභාවයෙන් යුතු ජනමාධ්‍ය භාවිතාවක් අනුගමනය කළ හැකි බවට ඔප්පු කර පෙන් වූ ජීවමාන සාක්ෂියක් බඳුය.

බිළිඳියන් මරා දැමීම සහ ගොවීන් සිය දිවි නසා ගැනීමේ සිට ආගමික මූලධර්මවාදය සහ පීතෘ මූලිකත්වය දක්වා වූ අනාවරණය නොවූ සහ වැරදි ලෙස වටහා ගෙන තිබූ කතා පුවත් ඇය විසින් වාර්තා කළාය. එලෙස වාර්තා කිරීම සඳහා ඇය නිතරම ක්ෂේත්‍රයට ගියාය. පර්යේෂකයින් සහ ක්‍රියාකාරිකයින් සමඟ සබඳතා ගොඩ නගා ගත්තාය. එමෙන්ම ඇය සිය ඇස්, කන් සහ මනස විවෘතව තබාගෙන සිටියාය.

කල්පනා විසින් විපත් සහ ගැටුම් පැවති කලාප බොහොමයක් පිළිබඳව මූලාරම්භයේ සිටම කළ වාර්තා කිරීම් තුළින් ජීවත්වීමේ අසීරුම මායිමේ සිටින මිනිසුන්ගේ බහුවිධ අරගලය මතු කර පෙන්නුවාය.

එවැනි ප්‍රජාවන් බොහොමයක් සඳහා සිරස්තල නිර්මාණය කරන සිද්ධීන් ඔවුන්ගේ දීර්ඝ සහ නිහඬ විඳදරා ගැනීම්වල ආසන්නතම සිදුවීමයි. මාධ්‍ය විසින් ඔවුන් පිළිබඳ සිරස්තල කරළියට ගෙන ඒම සහ විවිධ දේශපාලනඥයන් මැතිවරණ ව්‍යාපාර අතරතුර ජනතාව අතරට යාම අතර විශාල වෙනසක් නැත.




බොහෝ ජනමාධ්‍යවේදීන්ට නිතරම මඟ හැරෙන වටිනා පුවත් ඇය දුටුවාය. එමෙන්ම ඇය එම සිදුවීමෙහි පසු විපරමක් සිදු කිරීම සඳහා එම ස්ථානයටම මාස ගණනාවකට හෝ වසර ගණනාවකට පසුව ගියාය. සමහර අලුත් ප්‍රවෘත්ති හඹායන්නන් මෙන් නොව ඇය දිළිඳු ජනතාවගේ දුක්ඛ දෝමනස්සයන්ගෙන් අයුතු ප්‍රයෝජන නොගත්තාය.

"ආපදා සන්නිවේදනය - ආසියා පැසිෆික් මූලාශ්‍ර ග්‍රන්ථයට(TVEAP & UNDP, 2007)[6] ලියූ පරිච්ඡේදයක ඇය විසින් පසුවිපත් පිළිබඳ ඇයගේ අවබෝධය මෙසේ ඉදිරිපත් කර තිබුණි. "ආපදා විපත් පිළිබඳ වාර්තාවන් බොහොමයක් එකම ස්වරූපයක් ගනු ලබන්නේ වාර්තාකරුවන් දකින්නේ සුන්බුන්වලට යටින් ඇති දේ නොව, තමන් ඉදිරිපිට තිබෙන දෙය පමණක් වන වන බැවිනි. ඔවුහු වචනානුසාරයෙන් පමණක් සිදු වීම ගෙන හැර පාති.

විපත පැමිණීමට පෙර මෙම ප්‍රදේශය කලින් පැවතියේ කෙසේ ද? එහි විවිධ කණ්ඩායම් අතර සමාජ සම්බන්ධතා කෙසේ වීද? ප්‍රාන්ත රජය සමඟ එහි සබඳතා කොයි ආකාර වීද? එය ප්‍රතික්ෂේප වූවක් ද නැතිනම් ජනතාවට හිතකර වූවක් ද? ප්‍රාන්තයේ දේශපාලනය සඳහා එය කෙතරම් වැදගත් ද?

කල්පනා දිළිඳු කාන්තාවන්ගේ ඉරණම කෙරෙහි වැඩි සැලකිල්ලක් දැක්වූවාය. ඉතා දුක්ඛිත අන්තයක සිට ජීවන අරගලයෙහි නිරතව සිටින කාන්තාවන් පිළිබඳ ඇය ලියුවාය. මෙම අදෘශ්‍යමාන එහෙත් 'සුපිරි කාන්තාව' ඉන්දියාවේ සමාජ වියමන අල්ලා ගෙන සිටින්නේ කෙසේද යන්න නැවත නැවතත් ඇය ලියුවාය.

[6] Communicating Disasters: An Asia Pacific Resource Book. Edited by Nalaka Gunawardene and Frederick Noronha. TVE Asia Pacific and UNDP Asian Regional Centre, Bangkok. 2007. Available at: http://www.asiapacific. undp.org/content/rbap/en/home/library/climate-and-disaster-resilience/communicating-disasters-resourcebook. Html

ලොවට නොපෙනෙන මෙන් ම ඇගයීමට ලක් නොවූ කාන්තාවන් එක් දිනක් විශ්‍රාම ගතහොත් බොහෝ ප්‍රජාවන්ගේ සහ නිෂ්පාදන පද්ධතීන්වල ඇති ගෘහස්ත කාර්යයන්ගේ හා දරුවන් රැක බලා ගැනීමේ සිට අපද්‍රව්‍ය බැහැර කිරීමේ සිට ගොවිතැන දක්වා වූ කටයුතුත් මග නතර වී ඇණ හිටිනු ඇත. සැබෑ ලෝකයේ දී ඇයට එවැනි සුවපහසුවක්වත් විඳින්නට නොහැකිය.

වසර 19ක් පුරා දෙසතියකට වරක් අඛණ්ඩව (2015 අවසානය වන විට එය ක්‍රමයෙන් පුවත්පතෙන් ගැලවිණි) ඇය විසින් 'ද හින්දු' පුවත්පතට 'අනෙක් අර්ධය' *The Other Half* නමින් තීරු ලිපියක් ලීවාය. කාලීන තේමා වූ දේශපාලනය, සංස්කෘතිය, ක්‍රීඩා සහ පරිසරය වැනි දෑ ඊට මාතෘකා වූ අතර ඒ හා සම්බන්ධ ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ විවිධ පැතිකඩ ද ගවේෂණය කළාය. ඉතාමත් සූක්ෂම ලෙස කරුණු කාරණා, පුද්ගලබද්ධ ඥානය සහ සමාජ ක්‍රියාකාරීන්ගේ කර්කශභාවයෙන් වෙනස් වූ ඇයටම ආවේණික මතවාදයන් භාවිතා කරමින් ඇය ලේඛන කාර්යයෙහි නිරත වූවාය.

මිනිසුන්ගේ හඬට ඇහුම්කන් දෙමින්, ඔවුන් සමඟ දොඩමළු වෙමින් ඇය සංචාරය කළේ ඉන්දියාවේ ඇති දුෂ්කර ගම්මානවලට පමණක් නොවේ. මුම්බායි අග නගරයේ ජීවත් වන අතරතුරම එහි දරිද්‍රතාවය ආශ්‍රිත ගැටලූ, ස්ත්‍රී පුරුෂ අසමානතාව, දුර්වල පාරිසරික කළමනාකරණය සහ පාලනය පිළිබඳව ද ඒ හා සමානවම අවධානය යොමු කළාය.

ආසියාවේ විශාලතම මුඩුක්කු නිවාස සමූහය ලෙස සැලකෙන මුම්බායේ 'ධාරවී' මුඩුක්කු ගම්මානය පිළිබඳව 2000 වර්ෂයේ ඇය විසින් ඉතා වටිනා ග්‍රන්ථයක් සම්පාදනය කරනු ලැබුවාය. එහි දී සමාජ අසමානතාවය මෙන් ම එම ජනතාව තුළ පැවති ප්‍රශංසනීය නම්‍යශීලීත්වය යන අන්ත දෙකම පිළිබඳ ඇයගේ අවධානය යොමු වී තිබේ.

පෙන්ගුවින් ප්‍රකාශනයක් ලෙස ප්‍රකාශයට පත් වී ඇති 'ධාරවී සොයා යෑම- ආසියාවේ විශාලතම මුඩුක්කු පන්තියෙන් ඇසෙන කතා' *Rediscovering Dharavi-Stories from Asia's largest slum* නම් එම කෘතිය යුක්තිසහගතභාවය පිළිබඳ ආදර්ශයක් මෙන්ම මිනිසත්කම මුසුවුණු, පොළොවේ පයගසා කළ කෘතියක් ලෙස ද බොහෝ අය විසින් හඳුන්වා දී තිබේ. මෙය රචනා වූයේ එකී මුඩුක්කු පන්තියම පාදක කර ගනිමින් නිර්මාණය වුණු ස්ලම් ඩෝග් මිලියනයර් (2008) චිත්‍රපටය ගෝලීය ප්‍රේක්ෂකයින් අතරට යාමට වසර කිහිපයකට පෙරය.

කල්පනා ශර්මාගේ ලිපි දැන් *The Economic and Political Weekly (EPW)* වෙබ් අඩවියේ සහ ප්‍රවෘත්ති, තොරතුරු සහ විනෝදාස්වාද ලිපි අඩංගු *Scroll.in* වෙබ් අඩවියේ ද පළ වී ඇත.

**මූලාශ්‍ර** කල්පනා ශර්මාගේ බ්ලොග් අඩවිය http://kscribe-kalpanasharma.blogspot.com/

'ද හින්දු' පුවත්පතේ තීරු ලිපි එකතුව -
http://www.thehindu.com/opinion/columns/Kalpana_Sharma/

## දුප්පත්කම කෙතරම් හොඳින් මාධ්‍ය තුළ නිරූපණය කළ හැකිද?

මුම්බායේ මුඩුක්කුවක නූගත් තරුණයෙකු *Who Wants to Be a Millionaire@ (Kaun Banega Crorepati)* නම් ඉන්දියානු රූපවාහිනී රියැලිටි තරගයක පෙනී සිටියි. අවසන් ප්‍රශ්නය දක්වා ඉතා සාර්ථකව පිළිතුරු දෙන ඔහුගේ දැනුම පිළිබඳව වැඩසටහන මෙහෙයවන්නා සහ පොලීසිය සැක කරයි. ඉන්දියාවේ පසුතල තුළ රූගත කළ ස්ලම් ඩෝග් මිලියනයර් යනු එම තරුණයාගේ කතාවයි.

මුම්බායේ මුඩුක්කු තුළ කතාවක් ස්ථානගත කිරීමෙන් සහ සිනමාවට නැඟීමෙන් රටේ අප්‍රසන්න නාගරික දේහයේ පතුල අතිශයෝක්තියට නගා ඇති ලෙසටයි සමහර ඉන්දියානුවන්ට මෙය දැනුණේ. නමුත් ජ්‍යෙෂ්ඨ මාධ්‍යවේදිනී කල්පනා ශර්මා එය එසේ නොදුටුවාය.

පිරිසිදු ජලය, සනීපාරක්ෂාව හෝ විදුලිය පහසුකම් නොමැතිව ජීවත්වන මිලියන ගණනාවක් ඉන්දියානු ජනතාව පිළිබඳව චිත්‍රපටය තුළින් ලෝකය දැන ගන්නේ නම් එහි ඇති ගැටලුව කුමක්දැයි ඇය ප්‍රශ්න කරන්නීය.

'*Shantytowns in the Mind*' නමින් ඉන්දියන් එක්ස්ප්‍රස් පුවත්පතට 2009 ජනවාරි මුල් භාගයේ දී සංවේදී ලිපියක් ලියමින් කල්පනා වැදගත් කරුණු කිහිපයක් මතු කරයි. "ස්ලම් ඩෝග් මිලියනයර් චිත්‍රපටයේ සාර්ථකත්වය තුළින් ගැඹුරු ප්‍රශ්න කිහිපයක් මතු කරයි. ලේඛකයින්, සිනමාකරුවන්, මාධ්‍යවේදීන් ලෙස අපි දරිද්‍රතාවය නිරූපණය කරන්නේ කෙසේද? අප විසින් හැමවිටම සම්පූර්ණ, සමබර, සංවේදී නිරූපණයක් ඉදිරිපත් කරනු ලැබීම අපේක්ෂා කිරීම සාධාරණ ද? අප විසින් අපගේ ප්‍රේක්ෂකයින් සඳහා ලිවීම, සිනමාවට නැගීම අනිවාර්යයද? එසේම එහි ප්‍රතිඵලයක් ලෙස මිනිසුන් සංවේදී වේ නම් එයට කම් නැත. එසේම ඔවුන්ට ඒ තුළින් කරදරයක් වූවා නම් ඒ ද කම් නැත. අප අසාධාරණ යැයි කෙනෙකු සලකන්නේ නම් එසේ වූවා දෙන්.

ලේඛකයෙකු ලෙස, ජනමාධ්‍යවේදියෙකු හෝ සිනමාකරුවෙකු ලෙස ඔබට කළ හැකි හොඳම දේ මුල් බැස ගත් ගැටලුවකට පහන් එළියක් දැල්වීම බව අවසානයේ ඔබ වටහා ගනු ඇත. නමුත් විසඳුම හුදෙක්ම එම ආලෝකය තුළ හමු නොවනු ඇත. ඒ සඳහා තවත් බොහෝ පියවර ගත යුතුව ඇත." ලෙසින් ඇය එය අවසන් කරයි.

ප්‍රබන්ධයක් ලෙසින් ස්ලම්ඩෝග් මිලියනයර් චිත්‍රපටයේ කැමරාව නාභිගත වී තිබුණේ ඉන්දියාවේ මුඩුක්කුවල ළමයින් දෙසටය. ඔවුන්ගේ අනාගතය වෙනස් කිරීමට අප විසින් කළ යුත්ත තවමත් ලිය වී නැත. එහෙත් එය ප්‍රබන්ධයක් නොවේ.

සම්පූර්ණ ලිපිය : http(//indianexpress'com/article/opinion/columns/shantytowns-of-the-mind/

cepa
centre for poverty analysis

කවරයේ ඡායාරූපය ගයත්‍රි ලොකුගේ විසිනි

29, R. G. Senanayake Mawatha,
Colombo 7, Sri Lanka.

T +94 (011) 4690200, 2676955
F +94 (011) 2676959
E info@cepa.lk
W www.cepa.lk

UNESCO